# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த முன்னேற்ற அறிக்கை
# Annual Performance Report
# 2015

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Internal Affairs, Wayamba Development & Cultural Affairs

## අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 ට අනුව
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015

**ප්‍රකාශනය**

**සැලසුම් අංශය**
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
**15 වන මහල**
**සුහුරුපාය, බත්තරමුල්ල**
**2015 මැයි මස**

**ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය**

**කාර්යසාධන වාර්ෂික ප්‍රගතිය**



මානව හා භෞතික සම්පත් මැනවින් කළමණාකරණය කරමින් වසරක් පුරා ඉටු කළ කාර්ය භාරය සම්පිණ්ඩනය වන "වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015 " අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයගත ප්‍රගතිය වාර්තා කරයි. කාර්යසාධනය පිළිබඳ ප්‍රගතිය සටහන් කරන අවස්ථාව ජාතික වශයෙන් ඉතා වැදගත් ය. සංවර්ධනයේ ජාතික ඉලක්ක සපුරාගත් මේ අවස්ථාව ජයග්‍රාහී සුබවාදී ආකල්පවලින් සමන්විත වේ.

ආගමන විගමන කටයුතු හා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමයන් සාධනිය ප්‍රගතියක් අත්පත් කරගෙන තිබේ. එසේ ම, වයඹ පළාත තුළ ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයක් ස්ථාපනය කිරීමෙන් ජාතික සංවර්ධනයට උරදීමට ක්‍රියාකිරීම විශේෂත්වයකි. ජාතික සංස්කෘතික ප්‍රතිපත්ති ප්‍රකාරව ශ්‍රී ලංකාවේ සංස්කෘතිය නගාසිටුවීම අන්තර්ජාතික වශයෙන් සංස්කෘතික සම්බන්ධතා පවත්වා ගැනීම ආදී කටයුතු විධිමත් ව ඉටුකිරීමට හැකිවීම සම්බන්ධව කාර්ය සාධන ඵලදායීතාව ඉහළ අගයක් ගනී. ජාතික වශයෙන් වැදගත් වන වැඩසටහන් සම්පාදනය කිරීම හා එමගින් පොදු ජනතාවට ප්‍රතිඵල අත්පත් කර දීමේ හැකියාව ඉදිරි කාලයේ දී උදාකරගැනීම අපගේ මුඛ්‍යාර්ථයයි.

**එස්.බී.නාවින්න,**

**අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.**

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය**



**ජයග්‍රාහී වසරක ප්‍රගති සටහන**

ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ අනන්‍යතාව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තහවුරු කරමින් ජාතියේ පෞඪ සංස්කෘතික උරුමය සුරැකීම හා වයඹ සංවර්ධනයේ නියමුවා වීම සිය දැක්ම කර ගත් අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය තුළ අත්පත් කරගන්නා ලද ප්‍රගතිය ඉදිරිපත් කරන මොහොතට සම්බන්ධ වීමට ලැබීම භාග්‍යයකි.

මෙරට පුරවැසි තත්ත්වය අහිමි විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්ට ද්විත්ව පුරවැසිභාවය ප්‍රධානය කිරීමෙන් සිය මාතෘ භූමිය පිළිබඳ වූ ඔවුන්ගේ හිමිකම් යළි තහවුරු කිරීමට හැකි විය. ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධති සුරක්ෂිත කරන අතරතුර ජාතික ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින් කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව සැපයීම සඳහා මෙන් ම සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ ම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා වූ අත්‍යවශ්‍ය පියවර ගැනීමට හැකි වීම ද ජයග්‍රහණයකි.

වයඹ පළාත තුළ යටිතල පහසුකම් වැඩි දියුණු කරමින් ජනතාවාදී තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවීම මෙන් ම පසුගිය වසරේ දී සංස්කෘතික කටයුතු හා කලා ක්ෂේත්‍රයන්හි සිදු වූ ප්‍රවර්ධනාත්මක ප්‍රසාරණය ද සැළකිය යුතු වේ. විදේශයන් සමඟ අන්‍යෝන්‍ය සංස්කෘතික සහයෝගිතාව ගොඩනැංවීමෙහි ලා ඉකුත් වසර සාධනීය වසරකි.

වගකීම හා වගවීම අනිවාර්ය සේවා නියමයක් කරගත් අප අමාත්‍යාංශය, 2015 වසර තුළ දී සාක්ෂාත් කර ගත් ප්‍රගතිය තුළින් එළඹෙන ජයග්‍රාහී වසරක පෙරනිමිති ප්‍රකට කිරීමට සමත් ව ඇති බව පැහැදිලි ය.

**පාලිත තෙවරප්පෙරුම**
**අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය**

**පෙරවදන**

**මනා කළමනාකරණයේ විශිෂ්ට ඵලදායීතාව**



රටේ සංවර්ධන කාර්යයේ දී ජාතික වශයෙන් වැදගත් වන, වසරක් පුරා ක්‍රියාත්මක කළ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික ක්ෂේත්‍රවල ප්‍රගතිය සම්පිණ්ඩනය කෙරෙන "වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015" ප්‍රකාශයට පත්වන අවස්ථාව අභිමානවත් ය. ඉදිරි වැඩසටහන් සම්පාදනයේ දී මේ වාර්තාගත කරුණු ජාතික වශයෙන් වැදගත් ය.

ද්විත්ව පුරවැසි සහතික ප්‍රධානය, වීසා ලබාදීම, ජෛවමිතික ගමන් බලපත්‍ර හඳුන්වාදීම මෙන් ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේදී ජීවමිතික තොරතුරු ඇතුළත් විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ලබාදීමට සැලසුම් කිරීම ආදී වැඩසටහන් අභ්‍යන්තර කටයුතු ක්‍රියාවලියේ දී ප්‍රමුඛත්වයක් ගෙන තිබේ.වයඹ පළාත කේන්ද්‍රකරගත් සංවර්ධන ක්‍රියාවලිය ලේකම් කාර්යාලයක් පිහිටුවා විධිමත් ව කරගෙන යාමේ මූලික සැලසුම් සම්පාදනය වෙමින් පැවතීම සතුටට කරුණකි. ඓතිහාසික හා කලාත්මක වශයෙන් වැදගත් ජාතික උරුමයන් සංරක්ෂණය කරමින් ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සංස්කෘතික කටයුතුවල පුණර්ජීවයක් ඇති කිරීමට අප ගත් ක්‍රියාමාර්ග ඵලදායී තත්ත්වයක පවතී. වාර්ෂික ප්‍රතිපාදන මැනවින් උපයෝගී කරගෙන විධිමත් කළමනාකරණයක් යටතේ ක්‍රියාවට නැංවූ සියලු කාර්යයන් සඵල වූ බව මේ කාර්ය සාධන සනාථ කරයි. විශිෂ්ය ඵලදායීතාවක් ඉදිරියේ දී වාර්තාගත කිරීමට ඇප - කැප වී ක්‍රියා කරමු.

**ඩී. ස්වර්ණපාල**

ලේකම්

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015

2015 ජනවාරි 01 වන දින සිට ජනවාරි 18 වන දින තෙක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය බල පවත්වන ලදී. 2015 ජනවාරි 08 වන දින නව රජය බලයට පත්වීමත් සමගම 2015.01.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1897/15දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ඒකාබද්ධ කර සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලදී. පසුව 2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පිහිටුවන ලදී.

# අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
## වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015

පටුන                                                                                         පිටු අංක


**1. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** **09**

1.1 දැක්ම, මෙහෙවර, අරමුණු

1.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය – සංවිධාන සැලැස්ම

**2. පාලන කටයුතු** **11**

2.1 ප්‍රධාන නිලධාරි මණ්ඩලය - 2015

2.2 2015.12.31 දිනට අමාත්‍යාංශ සේවක සංඛ්‍යාව

2.2.1 ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි මණ්ඩලය

2.2.2 තෘතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය

2.2.3 ද්විතීක මට්ටමේ නිලධාරි මණ්ඩලය

2.2.4 ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

2.3 අමාත්‍යාංශයේ නිලධාරීන් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීම

2.4 2015 වසර තුළ අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ලබාගිය නිලධාරි සංඛ්‍යාව

2.4.1 ස්ථාන මාරුවීම්

2.4.2 විශ්‍රාම ලබා ගැනීම්

**2.අ. සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය** **15**

2.අ.1 සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය - 2015

2.අ.2 කාර්යභාරය - 2015

**3. මූල්‍යය කටයුතු** **16**

3.1 අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැඩසටහන් පිළිබඳ වියදම්

3.1.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

3.1.2 පුනරාවර්තන වියදම් විස්තර

3.1.3 ප්‍රාග්ධන වියදම් විස්තර

3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළ විස්තර

**4. අභ්‍යන්තර කටයුතු** **20**

4.1 කාර්යයභාරය

4.2 කාර්යයභාරය - 2015

4.2.1 ආගමන විගමන දෙපාර්තමේන්තුව

4.2.2 පුද්ගලයින්ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**5. වයඹ සංවර්ධන කටයුතු** **21**

5.1 වගකීම

5.2 ප්‍රගතිය 2015

5.2.1 වයඹ සංවර්ධන වැඩසටහන් සම්බන්ධිකරණය කිරීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග

5.2.2 ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමට අදාලව ගෙන ඇති ක්‍රියාමාර්ග

**6. සංස්කෘතික ප්‍රවර්ධනය** **23**

6.1 සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන

I. සංස්කෘතික මධ්‍යස්ථාන පාඨමාලා

II. ජාතික සහ ප්‍රාදේශීය සංස්කෘතික වැඩසටහන් සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන දායකත්වය

III. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සේවාව

IV. දේශීය නර්තන ශිල්පී සංචිතය

6.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය දායකත්වය දැක් වූ ජාතික වැඩසටහන් සහ පවත්වන ලද විශේෂ වැඩසටහන්
6.3 ප්‍රතිභා සම්මාන හා සහතික ප්‍රදානය
6.4 අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය
6.5 රසවින්දන වැඩසටහන් පැවැත්වීම
6.6 අස්පර්ශ උරුම සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6.7 ජන සංගීත සංරක්ෂණ ව්‍යාපෘතිය
6.8 මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල ජීවත්වන බෙරවාදන ශිල්පීන් පිළිබඳ අධ්‍යයනය
6.9 ශ්‍රී ලංකා ජාතික ලේඛක සංවිධානය
6.10 අමාත්‍යාංශ වෙබ් අඩවියට වෙබ් බිහිදොර එක් කිරීම

**7. සංස්කෘතික යටිතල පහසුකම් සංවර්ධනය** 33

7.1 සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නඩත්තු කටයුතු
I. 2015 වසර අවසන් වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාප්තිය
II. නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම - 2015
III. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම හා නඩත්තු කටයුතු - 2015
IV. 2015.12.31ට සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නඩත්තු කටයුතු වල සමස්ත මූල්‍යය ප්‍රගතිය
7.2 සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
I. ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය
II. සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනය ඉදිකිරීම - හික්කඩුව
III. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය - මාතර, නාවිමන, මොරකැටියහේන
IV. වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම
V. සංගීත හා නර්තන භාණ්ඩ නිෂ්පාදනය කරන පැරණි ශිල්ප ගම්මාන සංවර්ධනය කිරීම
VI. මහනුවර හා අනුරාධපුරයේ ප්‍රසංග කලා රඟහල් ඉදිකිරීම
VII. මහව ශිල්ප කලා ගම්මානය ඉදිකිරීම

**8. විදේශ සංස්කෘතික සබඳතා** 42

I. එළඹ ඇති ද්විපාර්ශ්වික ගිවිසුම්
II. 2015 වර්ෂයේදී එළඹි අවබෝධතා ගිවිසුම්
III. පවත්වන ලද සංස්කෘතික සහයෝගිතා වැඩසටහන්
IV. ශ්‍රී ලංකාවට විදේශීය කණ්ඩායම් පැමිණීම්

**9. සැපයුම් හා ප්‍රසම්පාදන කටයුතු** 46

9.1 සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ/සේවා ලබාදීම
9.2 අමාත්‍යාංශය සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

**10. ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ** 48

10.1 අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැඩසටහන් සඳහා නොමිලේ ලබාදුන් සේවාවන්
10.2 ජාතික පුහුණු මධ්‍යස්ථානය විසින් මුදල් අයකර ලබාදුන් සේවාවන්

**11. අභ්‍යන්තර විගණන කටයුතු** 49

11.1 සාමාන්‍ය විගණන පරීක්ෂාවන්
11.2 විශේෂ විගණන පරීක්ෂාවන්

# 1. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## 1.1 දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ අනන්‍යතාවය දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් තහවුරු කරමින්, ජාතියේ ප්‍රෞඪ සංස්කෘතික උරුමය සුරැකීම සහ වයඹ සංවර්ධනයේ නියමුවා වීම.

**මෙහෙවර**

සිය දේශය තුළ දී ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම ද, ජාතික ආරක්ෂාව හා ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින් රටින් බැහැරවන්නන් හා රටට ඇතුලුවන්නන් නියාමනය කිරීම මඟින් ප්‍රත්‍යන්ත පාලනය තහවුරු කිරීම ද, ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ වයඹ පළාත තුළ තිරසාර සමාජ, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.


**අරමුණු**

- දීප ව්‍යාප්තව ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය ක්‍රියාත්මක කිරීම තුළින් දේශීය සංස්කෘතියේ ජාතික අනන්‍යතාවය සහ විවිධත්වය සහතික කිරීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම.
- අන්තර්ජාතික පිරිවිතරයන් හා ප්‍රමිතීන්ට අනුකූලව, ශ්‍රී ලාංකේය අනන්‍යතාවය හා ජාතික ආරක්ෂාව තහවුරු කරමින්, සංචරන පාලන කටයුතු මෙහෙයවීම.
- ශ්‍රී ලාංකික පුරවැසියන් ලියාපදිංචි කරමින් ජාතික පුද්ගල නාමලේඛණයක් ස්ථාපිත කර, පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම උදෙසා හිමිකම් ලබන තැනැත්තන්හට හඳුනාගැනීමේ පත්‍ර නිකුත් කිරීම.
- සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම තුළින් මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය, රසාස්වාදය උදෙසා අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- වයඹ පළාත තුළ කඩිනම් සමාජ, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට සහ එම පළාතේ ජනතාවට සුවිශේෂී වූ ගැටළු විසඳීමට දායක වීම.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

# 1.2 අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - සංවිධාන සැලැස්ම - 2015



# 2. පාලන කටයුතු

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සියළුම පරිපාලනමය කටයුතු ක්‍රියාත්මක කරලීම හා එහි අධීක්ෂණ ක්‍රියාවලිය පාලන කටයුතු යටතේ සිදු කෙරේ.

## 2.1 ප්‍රධාන නිලධාරි මණ්ඩලය- 2015

| | තනතුර | නම |
|---|---|---|
| 1. | අමාත්‍යාංශ ලේකම් | වසන්ත ඒකනායක මහතා - 2015.01.21 දක්වා<br>එච්.ඩී.එස්.මල්කාන්ති මහත්මිය - 2015.01.21 සිට 2015.09.09 දක්වා<br>ඩී.ස්වර්ණපාල මහතා - 2015.09.09 සිට |
| 2. | අතිරේක ලේකම්(පාලන හා මුදල්/විදේශ) | එස්.එම්.ජී.එන්. ධර්මසේකර මහතා |
| 3. | අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන /ඉදිකිරීම්) | එච්.ඩී.එස්.මල්කාන්ති මහත්මිය - 2015.01.21 දක්වා<br>ප්‍රදීපා සේරසිංහ මහත්මිය - 2015.02.05 සිට |
| 4. | අතිරේක ලේකම් (අභ්‍යන්තර කටයුතු) | බර්නාඩ් වසන්ත මහතා |
| 5. | අතිරේක ලේකම් (සංවර්ධන) | ඩබ්.ජේ.ඩී.එස්. ගුණසිංහ මහතා - 2015.10.31 දක්වා |
| 6. | ප්‍රධාන ගණකාධිකාරී | ආර්.එම්.එම්. රත්නායක මහත්මිය |
| 7. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | කේ.කේ.ජී.සිසිර කුමාර මහතා |
| 8. | අධ්‍යක්ෂ(සැලසුම්) | කේ.ඩබ්ලිව්.එස්.පී.අතුකෝරල මහත්මිය - 2015.07.30 දක්වා<br>එම්.එම්.ජී.කේ මීගහකොටුව මහත්මිය - 2015.12.21 සිට |
| 9. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන/ ඉදිකිරීම්) | ඩබ්.සුනීතා කුරේ මහත්මිය - 2015.04.10 දක්වා<br>හේමන්ත වන්නි ආරච්චි මහතා |
| 10. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන/මධ්‍යස්ථාන පාලන/විදේශ) | තරණි අනෝජා ගමගේ මහත්මිය |
| 11. | ගණකාධිකාරී | එම්.ටී.එස්. පියසේන මහත්මිය<br>එච්.ජී.ජේ. සමන්තිලක මහතා -2015.11.03 දක්වා |
| 12. | ගණකාධිකාරී(ප්‍රසම්පාදන) | ජනිත ඩී. හතරසිංහ මහතා |
| 13. | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ප්‍රසාද් රණසිංහ මහතා<br>ආර්.එස්. හර්ෂණී පීරිස් මහත්මිය - 2015.01.19 සිට |
| 14. | සහකාර ලේකම් (පාලන,මුදල්,විදේශ,ප්‍රවාහන) | ඩී. ලියනගම මහත්මිය<br>බුද්ධිකා දිසානායක මහත්මිය- 2015.05.18 සිට |
| 15. | සහකාර ලේකම්(ප්‍රවර්ධන, ඉදිකිරීම්) | බී.ජේ.අයි.පියුමි මහත්මිය |
| 16. | සහකාර ලේකම්(සංවර්ධන) | දිලුම් දයාරත්න මහතා |
| 17. | නීති නිලධාරී | ඩී.එස්. ජයවීර මහත්මිය |
| 18. | ඉංජිනේරු | ඒ.ජී. මුනාස් මහතා |
| 19. | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | මංගලා වාකිෂ්ඨ මහත්මිය - 2015.01.21 දක්වා<br>ආර්.පී.ජී. සමන් කුමාර මහතා - 2015.01.21 සිට 2015.09.09 දක්වා<br>ටී.එම්.එම්.පී. වියෝනී ප්‍රනාන්දු මහත්මිය - 2015.09.14 සිට |
| 20. | පරිපාලන නිලධාරී | දයානි දිසානායක මහත්මිය |
| 21. | භාෂා පරිවර්තක | එච්.ඒ.ආර්.සී. හේවාආරච්චි මහත්මිය<br>කුමාරි රත්නායක මහත්මිය |

## 2.2. 2015.12.31 දිනට අමාත්‍යාංශ සේවක සංඛ්‍යාව

### 2.2.1. ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත | | | දැනට සිටින | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | |
| ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | විශේෂ | SL–4- 2006 | **01** | 01 | **-** | **-** | 01 | **-** | - | |
| අතිරේක ලේකම් | ශ්‍රී . ල. ප. සේ. | විශේෂ | SL–3-2006 | **01** | 03 | **-** | **-** | 03 | **-** | - | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී . ල. ප. සේ. | I | SL–1-2006 | **01** | 03 | **-** | **-** | 03 | - | - | |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී. ල. ග. සේ. | I | SL–1-2006 | **01** | 01 | **-** | **-** | 01 | - | - | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ල. ග. සේ. | I | SL–1-2006 | **01** | **01** | **-** | **-** | **01** | - | - | |
| අධ්‍යක්ෂ | ශ්‍රී . ල. ක්‍රා. සේ. | විශේෂ | SL–3-2006 | **01** | 01 | **-** | **-** | 01 | **-** | - | |
| අභ්‍යන්තර විගණක | ශ්‍රී . ල. ග. සේ. | I | SL–1-2006 | **01** | 01 | | | | | | |
| ගණකාධිකාරී | ශ්‍රී . ල. ග. සේ. | **III** | SL–1-2006 | **01** | **03** | **-** | **-** | **03** | - | - | |
| සහකාර ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | **III** | SL–1-2006 | **01** | 05 | - | - | 04 | - | - | |
| සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ල. ක්‍රා. සේ. | **III** | SL–1-2006 | **01** | 02 | - | - | **03** | **-** | **-** | |
| නීති නිලධාරි | දෙපාර්තමේන්තු ගත | **III/ II** | SL–1-2006 | **01** | 01 | - | - | 01 | **-** | **-** | |
| ඉංජිනේරු | ශ්‍රී . ල. ඉ. සේ. | **II** | SL–1-2006 | **01** | 01 | - | - | **01** | - | **-** | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | 23 | | | 22 | | | |

### 2.2.2. තෘතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පරිපාලන නිලධාරි | රා. ක. ස. සේ | අධි ශ්‍රේණිය | MN 07 2006 | **02** | 01 | - | - | 01 | - | - | නැත |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | - | | 02 | 01 | **-** | **-** | 01 | **-** | - | |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | **II/ I** | MN **06-2006** | 02 | **03** | **-** | **-** | **02** | **-** | - | |
| **තෘතීයික මට්ටම** | | | | | 05 | | | 04 | | | |

## 2.2.3. ද්විතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත | | | දැනට සිටින | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලි | කොන්ත්‍රාත් | |
| සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි | ආශ්‍රිත සේවා | **III/II/I** | **MN 4 – 2006 A** | 03 | **201** | - | - | 186 | - | - | |
| ★ සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරී සේවය | **III/II/I** | **MN 4 – 2006 A** | 03 | 161 | - | - | 141 | - | - | |
| කාර්මික නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | **III/II/I** | **MN 3 – 2006 A** | 03 | 01 | - | - | - | - | - | |
| සැලසුම් ශිල්පී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | **III/II/I** | **MN 3 – 2006 A** | 03 | 01 | - | - | - | - | - | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක. ස. සේ. | **III/II/I** | **MN 2 – 2006 A** | 03 | 70 | - | - | 55 | - | - | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | **III** | **MT1 – 2006A** | **03** | **01** | **-** | **-** | **01** | **-** | **-** | |
| වීඩියෝ කැමරා ක්‍රියාකරවන්නා | තාවකාලික | - | **MT1 – 2006A** | 03 | 01 | - | - | 01 | - | - | |
| නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | - | **MT1 – 2006A** | 03 | 01 | - | - | 01 | - | - | |
| සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තුගත | **III/II/I** | **MN** 1 | 3 | **201** | **-** | **-** | 153 | **-** | **-** | |
| **ද්විතීයික මට්ටම** | | | | | **638** | | | **538** | | | |

★ ආශ්‍රිත සේවයේ නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කෙරෙමින් පවතින බැවින් අදාල සියළු තනතුරු සංවර්ධන නිලධාරී ලෙස දක්වා ඇත.

## 2.2.4. ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | **III/II/I** විශේෂ | **PL 3-2006A** | 04 | 31 | -` | - | **34** | - | - | |
| කා.කා.ස. | එම | **III/II/I** විශේෂ | **PL 1-2006A** | 04 | 33 | - | - | **32** | - | - | |
| පිළිගැනීමේ නිළධාරී | දෙපාර්තමේන්තුගත | **III/II/I** | **PL 1-2006A** | | 01 | | | | | | |
| සංස්කෘතික මධ්‍යස්ථාන කා.කා.ස. | දෙපාර්තමේන්තුගත | **III/II/I** විශේෂ | **PL 1-2006A** | | **201** | | | 188 | | | **අනියම් 13** |
| සංස්කෘතික මධ්‍යස්ථාන මුරකරු | දෙපාර්තමේන්තුගත | **III/II/I** විශේෂ | **PL 1-2006A** | | 201 | | | **★291** | | | |
| කැමරා ක්‍රියාකරු සහායක | දෙපාර්තමේන්තුගත | - | **PL 1-2006A** | 03 | 01 | - | - | 01 | - | - | |
| **ප්‍රාථමික මට්ටම** | | | | | **468** | | | **546** | | | |

★ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **25/2014** යටතේ **114**ක් බඳවා ගෙන ඇත.

## 2.3 අමාත්‍යාංශයේ නිලධාරීන් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම

**2015 වසර තුළ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම**

| | පුහුණු වැඩසටහන | සහභාගිත්වය |
|---|---|---|
| 01 | SLIDA ආයතනය මගින් පැවැත් වූ විවිධ වූ පුහුණු වැඩසටහන් | **60** |
| 02 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | **11** |
| 03 | ලිපිගොනු ලේඛනාගාරය වෙත යොමු කිරීම | අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් |
| 04 | සිංහල ඩිප්ලෝමා පාඨමාලාව | **01** |
| 05 | නිපුණතා පියස මගින් පැවැත්වූ පුහුණු වැඩසටහන් | 40 |

## 2.4 2015 වසර තුළ අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් / විශ්‍රාම ලබාගිය නිලධාරි සංඛ්‍යාව පහත දක්වා ඇත.

### 2.4.1. ස්ථාන මාරුවීම්

| | නම | සේවය |
|---|---|---|
| 01 | ආර්.ඒ.එල්. අනෝමා මිය | රා.කළ.ස. |
| 02 | එච්.කේ.සී. ප්‍රියදර්ශනී මිය | එම |
| 03 | ජී.එල්.ජේ.පී. හේරත් මිය | එම |
| 04 | එල්.පී.ඒ.එස්. ජයවර්ධන මිය | එම |
| 05 | ඊ.එම්.එන්. සංජීවනී මිය | එම |
| 06 | ඩබ්.ඩී.සී. පුෂ්පමාලා මිය | එම |
| 07 | සී.එල්.පී. පෙරේරා මිය | එම |
| 08 | එස්. හේවාවසම් මිය | එම |
| 09 | පී.ඒ.එල් ජයලත් මිය | එම |
| 10 | ඩබ්.අයි.ජේ.එම්. පෙරේරා මිය | එම |
| 11 | ජේ.ඒ.එම්. මධූ ජයකොඩි මිය | සංවර්ධන නිලධාරී |

### 2.4.2. විශ්‍රාම ලබාගැනීම

| | නම | සේවය |
|---|---|---|
| 01 | ඩබ්.සුනීතා කුරේ මහත්මිය | ශ්‍රී. ල. ප. සේ. |
| 02 | ඒ.ජී.එස්. ද සිල්වා මිය | රා.කළ.ස. |
| 03 | කේ.ඩී. රූපා රංජනී මිය | එම |
| 04 | එච්.ටී.එම්.එන්. රණවීර මිය | එම |
| 05 | ඩබ්.ඒ.ඩී.ඒ. ශ්‍රී. දිසානායක මයා | රියැදුරුII |
| 06 | ජී. ඩබ්. රාජපක්ෂ මයා | කා.කා.ස. |
| 07 | ඩබ්.එම්.ඒ. විජේකෝන් මයා | සං.ම. කා.ස. |
| 08 | වයි.ඩබ්. රණවීර මයා | සං.ම. කා.ස. |

# 2.අ. සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සියළු ම සංස්කෘතික මධ්‍යස්ථානවල පරිපාලන හා අධීක්ෂණ කටයුතු මධ්‍යස්ථාන පාලන අංශය මගින් සිදු කෙරේ.

## 2.අ.1. සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය - 2015

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| I. සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | 186 |
| II. සංවර්ධන නිලධාරී | 132 |
| III. සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | 153 |
| IV. මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහායක | 201 |
| V. මධ්‍යස්ථාන මුරකරු | 291(25/2014 චක්‍රලේඛයට අනුව 114ක් බඳවා ගෙන ඇත) |
| VI. ආදේශක මුරකරු | 64 |

## 2.අ.2. කාර්යභාරය - 2015

1. ඉහත අංක I සිට VI දක්වා වූ තනතුරුවලට අදාල පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම
2. අනියම් තනතුරු සඳහා ලිපිගොනු පවත්වාගෙන යාම
3. සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ සියළු ම නිවාඩු වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යාම
4. ණය ලිපිගොනු පවත්වාගෙන යාම

| | විස්තරය | ගොනු ගණන |
|---|---|---|
| i. | ආපදා ණය ගෙවීම් | 74 |
| ii. | දේපළ ණය ගෙවීම් | 25 |
| iii. | උත්සව අත්තිකාරම් ගෙවීම් | 625 |
| iv. | විශේෂ අත්තිකාරම් | 50 |

5. වාර්ෂික ස්ථානමාරු කිරීම් සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කිරීම

| | විස්තරය | ඉල්ලුම්පත් ගණන |
|---|---|---|
| i. | සංස්කෘතික ප්‍රවර්ධන නිළධාරීන් | 49 |
| ii. | සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිළධාරීන් | 39 |
| iii. | මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහායක | 23 |
| iv. | මධ්‍යස්ථාන මුරකරු | 22 |

6. අග්‍රහාර රක්ෂණ ගෙවීම් - 160
7. කාර්ය මණ්ඩලයේ විනය පරීක්ෂණ සම්බන්ධව කටයුතු සිදු කිරීම

| | විස්තරය | ගොනු ගණන |
|---|---|---|
| i. | විනය පරීක්ෂණ | 10 |
| ii. | අභ්‍යන්තර විගණන පරීක්ෂණ | 15 |
| iii. | මධ්‍යස්ථාන හදිසි පරීක්ෂාවන් | 02 |
| iv. | අවවාද කිරීම් | 07 |
| v. | පිළිතුරු සැපයීම් | 10 |

8. කාර්ය මණ්ඩලය සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

| | | |
|---|---|---|
| i. | කාර්යාල කාර්ය සහායක | 15 |
| ii. | මුරකරු | 133 |
| iii. | සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | 08 |
| iv. | සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි | - |
| v. | සංවර්ධන නිලධාරීන් | 07 |

9. කාර්ය මණ්ඩල බඳවා ගැනීම්

| | | |
|---|---|---|
| i. | මුරකරු | - 114 ස්ථිර(25/2014 රා.ප.ච. අනුව) |
| ii. | කාර්යාල කාර්ය සහායක | - ස්ථිර 06 අනියම් 12 |
| iii. | ආදේශ මුරකරු | - 06 |

# 3. 2015 මූල්‍ය කටයුතු

## 3.1 අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැඩසටහන් පිළිබඳ වියදම්

### 3.1.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

| අංකය | විස්තරය | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම | | | |
| 1. 1 | අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශ පරිපාලනය හා ආයතනික සේවා | 262,400,000.00 | 239,959,230.70 | 91 |
| 1. 2 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 626,800,000.00 | 580,522,392.42 | 93 |
| | උප එකතුව | **889,200,000.00** | **820,481,623.12** | 92 |
| 02 | ප්‍රාග්ධන වියදම් | | | |
| 2. 1 | අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශ පරිපාලනය හා ආයතනික සේවා | 1,518,775,000.00 | 61,959,703.13 | 4 |
| 2. 2 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,004,969,000.00 | 441,688,339.43 | 22 |
| | උප එකතුව | **3,523,744,000.00** | **503,648,042.50** | **14** |
| | මුළු එකතුව | **4,412,944,000.00** | **1,324,129,665.68** | **33** |

### 3.1.2. පුනරාවර්තන වියදම් විස්තර

- සේවක වැටුප් පිළිබඳ වියදම් හා වැටුප් සමග ගෙවනු ලබන ජීවන අංක දීමනාව

| වැය විෂය | විස්තරය | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශත % |
|---|---|---|---|---|
| සේවක වැටුප් පිළිබඳ වියදම | | | | |
| 163-1-1-1001 | අමාත්‍ය කාර්යාලය | 5,800,000.00 | 4,579,191.42 | 79 |
| 163-1-2-1001 | අමාත්‍යාංශ පරිපාලනය | 41,700,000.00 | 40,264,372.18 | 97 |
| 163-2-3-1001 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 154,000,000.00 | 153,770,418.83 | 100 |
| | උප එකතුව | **201,500,000.00** | **198,613,982.43** | 99 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | | | | |
| 163-1-1-1002 | අමාත්‍ය කාර්යාලය | 1,450,000.00 | 1,446,765.00 | 100 |
| 163-1-2-1002 | අමාත්‍යාංශ පරිපාලනය | 3,100,000.00 | 3,076,523.47 | 99 |
| 163-2-3-1002 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 8,500,000.00 | 8,499,864.60 | 100 |
| | උප එකතුව | **13,050,000.00** | **13,023,153.07** | **100** |
| වැටුප් සමග ගෙවනු ලබන දීමනා | | | | |
| 163-1-1-1003 | අමාත්‍ය කාර්යාලය | 5,800,000.00 | 5,185,321.27 | 89 |
| 163-1-2-1003 | අමාත්‍යාංශ පරිපාලනය | 45,880,000.00 | 44,791,902.45 | 98 |
| 163-2-3-1003 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 215,100,000.00 | 214,263,862.55 | 100 |
| | උප එකතුව | **266,780,000.00** | **264,241,086.27** | **99** |
| | මුළු එකතුව | **481,330,000.00** | **475,878,221.77** | **99** |

➢ වෙනත් පුනරාවර්තන වියදම්

| වැය විෂය | විස්තරය | 2015වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශත % |
|---|---|---|---|---|
| ගමන් වියදම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 1,650,000.00 | 1,650,000.00 | 100 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 5,050,000.00 | 2,816,573.17 | 56 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,700,000.00 | 3,203,075.84 | 87 |
| | උප එකතුව | **10,400,000.00** | **7,669,649.01** | **74** |
| සැපයීම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 5,840,000.00 | 4,962,791.82 | 85 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 17,260,000.00 | 12,314,243.26 | 71 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 7,800,000.00 | 5,274,893.78 | 68 |
| | උප එකතුව | **30,900,000.00** | **22,551,928.86** | **73** |
| නඩත්තු වියදම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 3,060,000.00 | 3,007,132.96 | 98 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 8,755,000.00 | 8,437,163.01 | 96 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,200,000.00 | 3,190,469.04 | 100 |
| | උප එකතුව | **15,015,000.00** | **14,634,765.01** | **97** |
| සේවා | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 5,300,000.00 | 3,068,767.12 | 58 |
| | අමාත්‍යාංශ පරිපාලනය | 109,885,000.00 | 102,663,027.84 | 93 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,000,000.00 | 1,404,383.56 | 70 |
| | උප එකතුව | **117,185,000.00** | **107,136,178.52** | **91** |
| රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | | | | |
| | අමාත්‍යාංශ පරිපාලනය | 1,870,000.00 | 1,695,455.73 | 91 |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,500,000.00 | 2,500,000.00 | 100 |
| | උප එකතුව | **4,370,000.00** | **4,195,455.73** | **96** |
| අනිකුත් වැඩසටහන් | | | | |
| | සම්මාදම් හා දායක මුදල් (සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට දායක මුදල්) | 37,000,000.00 | 15,673,813.83 | 42 |
| | දඹාන ජන උරුම කේන්ද්‍රය නඩත්තු කිරීම | 2,000,000.00 | 1,972,764.00 | 99 |
| | ජාතික සාහිත්‍ය කලා උත්සවය | 8,000,000.00 | 7,217,746.32 | 90 |
| | විශේෂ සිදුවීම් සහ සමාජ සංස්කෘතික කටයුතු | 10,000,000.00 | 9,925,960.47 | 99 |
| | රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම | 3,000,000.00 | 2,719,449.00 | 91 |
| | සංස්කෘතික මධ්‍යස්ථාන පුහුණු වැඩසටහන් සඳහා | 145,000,000.00 | 131,029,781.70 | 90 |
| | විදේශ සබඳතා | 25,000,000.00 | 19,875,908.90 | 80 |
| | උප එකතුව | 230,000,000.00 | 188,415,424.22 | 82 |
| මුළු එකතුව | | **407,870,000.00** | **344,603,401.35** | **84** |

### 3.1.3 ප්‍රාග්ධන වියදම් විස්තර

➢ ගෘහ භාණ්ඩ , කාර්යාලීය උපකරණ හා යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම

| වැය විෂය | විස්තරය | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශය % |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ භාණ්ඩ මිළදී ගැනීම | | | | |
| 163-1-1-2102 | අමාත්‍ය කාර්යාලය | 1,700,000.00 | 1,282,638.20 | 75 |
| 163-1-2-2102 | අමාත්‍යාංශ පරිපාලනය | 2,600,000.00 | 476,687.00 | 18 |
| | උප එකතුව | **4,300,000.00** | **1,759,325.20** | **41** |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම | | | | |
| 163-1-1-2103 | අමාත්‍ය කාර්යාලය | 1,500,000.00 | 685,050.00 | 46 |
| 163-1-2-2103 | අමාත්‍යාංශ පරිපාලනය | 2,800,000.00 | 2,799,327.56 | 100 |
| 163-2-3-2103 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,000,000.00 | 1,820,317.00 | 91 |
| | උප එකතුව | 6,300,000.00 | 5,304,694.56 | 84 |
| | | | | |
| | මුළු එකතුව | **10,600,000.00** | **7,064,019.76** | **67** |

➢ යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි හා වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල්

| වැය විෂය | විස්තරය | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා වැයවූ මුදල් | | | | |
| 163-1-1-2001 | අමාත්‍ය කාර්යාලය | 1,000,000.00 | 0.00 | 0 |
| 163-1-2-2001 | අමාත්‍යාංශ පරිපාලනය | 650,000.00 | 592,775.00 | 91 |
| | උප එකතුව | **1,650,000.00** | **592,775.00** | **36** |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 163-1-1-2002 | අමාත්‍ය කාර්යාලය | 200,000.00 | 96,152.00 | 48 |
| 163-1-2-2002 | අමාත්‍යාංශ පරිපාලනය | 510,000.00 | 316,144.76 | 62 |
| 163-2-3-2002 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 1,500,000.00 | 1,481,425.00 | 99 |
| | උප එකතුව | **2,210,000.00** | **1,893,721.76** | **86** |
| වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 163-1-1-2003 | අමාත්‍ය කාර්යාලය | 600,000.00 | 554,014.80 | 92 |
| 163-1-2-2003 | අමාත්‍යාංශ පරිපාලනය | 4,800,000.00 | 4,484,231.55 | 93 |
| 163-2-3-2003 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,600,000.00 | 3,359,106.22 | 93 |
| | උප එකතුව | **9,000,000.00** | **8,397,352.57** | **93** |
| | මුළු එකතුව | **12,860,000.00** | **10,883,849.33** | **85** |

➢ ව්‍යාපෘති හා පුහුණු කටයුතු වෙනුවෙන් වැය වූ මුදල්

| වැය විෂය | විස්තරය | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ප්‍රධාන ව්‍යාපෘති වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 163-01-02-01-2502 | e-NIC Project | 1,500,000,000.00 | 49,406,132.36 | 3 |
| 163-2-3-12-2502 | පවත්නා අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම | 600,000.00 | 594,854.00 | 99 |
| 163-2-3-14-2502 | දේශීය සාම්ප්‍රදායික දැනුම හා සංස්කෘතික වටිනාකම් නිරාවරණය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය | 2,000,000.00 | 860,429.54 | 43 |

| වැය විෂය | විස්තරය | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 163-2-3-15-2502 | එල්ෆින්ස්ටන් රඟහල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | 200,000,000.00 | 50,263,721.25 | 25 |
| 163-2-3-16-2502 | සංස්කෘතික මධ්‍යස්ථාන පහසුකම් වැඩිදියුණු කිරීම | 4,000,000.00 | 4,000,000.00 | 100 |
| 163-2-3-17-2502 | සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා වන සේවස්ථ පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | 2,000,000.00 | 1,885,875.29 | 94 |
| 163-2-3-18-2502 | ආදිවාසී ගම්මාන සංරක්ෂණය | 7,500,000.00 | 5,156,064.91 | 69 |
| 163-2-3-19-2502 | සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 47,000,000.00 | 13,722,320.97 | 29 |
| 163-2-3-20-2502 | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම | 150,000,000.00 | 150,000,000.00 | 100 |
| 163-2-3-21-2502 | ශිල්ප ගම්මාන වැඩසටහන | 5,000,000.00 | 0.00 | 0 |
| 163-2-3-23-2502 | සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම(උගත් පාඩම් කොමිෂමේ නිර්දේශ ද ඇතුළත්ව) | 180,000,000.00 | 139,472,971.18 | 77 |
| 163-2-3-24-2502 | ප්‍රසංග කලා රඟහල් ඉදිකිරීම අනුරාධපුරය සහ මහනුවර | 500,000,000.00 | 1,535,892.00 | 0 |
| 163-2-3-25-2502 | අංගම්පොර ගම්මානය -මහව | 30,000,000.00 | 30,000,000.00 | 100 |
| 163-2-3-26-2502 | සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා සංගීත උපකරණ ලබාදීම | 35,000,000.00 | 31,371,900.86 | 90 |
| 163-2-3-28-2502 | සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීම(GOSL-INDIA)) | 800,000,000.00 | 0.00 | 0 |
| 163-2-3-30-2502 | උරුම තොරතුරු හා ක්‍රියාකාරකම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | 15,000,000.00 | 0.00 | 0 |
| 163-2-3-31-2502 | ජාතික උරුමයන් සංරක්ෂණ හා ප්‍රවර්ධන වැඩසටහන් | 17,769,000.00 | 5,244,649.11 | 30 |
| | **උප එකතුව** | **3,495,869,000.00** | **483,514,811.47** | **14** |
| **පුහුණු කිරීම් හා හැකියා වර්ධනය** | | | | |
| 163-01-02-2401 | අමාත්‍යාංශ පරිපාලනය | 2,415,000.00 | 1,266,549.50 | 52 |
| 163-02-03-2401 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,000,000.00 | 918,812.10 | 46 |
| | **උප එකතුව** | **4,415,000.00** | **2,185,361.60** | **49** |
| | **මුළු එකතුව** | **3,500,284,000.00** | **485,700,173.07** | **14** |

## 3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළ විස්තර - 2015

| ණය වර්ගය | ණය ලබාගෙන ඇති නිලධාරින් ගණන | වැය වූ මුදල රු. |
|---|---|---|
| ආපදා ණය | 202 | 19,754,397.00 |
| උත්සව අත්තිකාරම් | 899 | 8,990,000.00 |
| විශේෂ අත්තිකාරම් | 123 | 492,000.00 |
| ගංවතුර අත්තිකාරම් | - | - |
| පාපැදි ණය | - | - |
| **එකතුව** | **1,224** | **29,236,397.00** |

# 4. අභ්‍යන්තර කටයුතු

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත් ද මූල්‍යය සම්පත් ද එම දෙපාර්තමේන්තුවල අභිමතාර්ථ වෙනුවෙන් ප්‍රශස්ථ ලෙස උපයෝගී කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම, සම්බන්ධීකරණය,මග පෙන්වීම හා පසු විපරම අභ්‍යන්තර කටයුතු අංශය වෙත පැවරී තිබේ.

## 4.1 කාර්යයභාරය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සියලුම ආයතනික කටයුතු (විදේශ නිවාඩු, අතිකාල දීමනා සඳහා අනුමැතිය ලබාදීම, බඳවාගැනීම්, ස්ථාන මාරු, උසස් කිරීම්, විනය පරීක්ෂණ), විගණන හා කළමනාකරණ කමිටු මෙහෙයවීම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම යනාදී වේ.

## 4.2 කාර්යයභාරය 2015

### 4.2.1 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

i. ශ්‍රී ලංකා පුරවැසිභාවය ප්‍රදානය කිරීමට යොමු කරන නාමලේඛන සඳහා අනුමැතියන් 904 ක් ලබා දී ඇත.

- 5 (2) වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම - 865
- 8 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම - 09
- 11 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම - 26
- 12 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම - 04

ii. ශ්‍රී ලංකා පුරවැසිභාවය අත්හැරීමේ නාමලේඛන සඳහා 19 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම් 25 ක් සිදුකර ඇත.

iii. ද්විත්ව පුරවැසි සහතික පත්‍ර 2341ක් ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

iv. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ආයෝජකයන් සඳහා වීසා ලබාදීමට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා දේ.

v. ජෛවමිතික ගමන් බලපත්‍රය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි..

vi. හිස් ගමන් බලපත්‍ර මි.ලි 1.5 ක් නැවත ඇණවුමක් ලෙස ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත මිල දී ගැනීමේ කාර්යය කඩිනම් කරන ලදී.

### 4.2.2 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

i. දැනට භාවිතා වන හඳුනා ගැනීමේ පත්‍රය වෙනුවට නව හඳුනා ගැනීමේ පත්‍රයක් අදේශ කර ගැනීම අරමුණු කොට ගෙන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සංශෝධනය කිරීම.

ii. ජීවමිතික තොරතුරු ඇතුලත් පුද්ගල දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට අදාල විධිවිධාන සැලසීම සඳහා 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම.

iii. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සුහුරුපාය ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.

# 5. වයඹ සංවර්ධන කටයුතු

යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව අමාත්‍යාංශ පිහිටුවීමේදී 2015 සැප්තැම්බර් මස 21 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

වයඹ පළාතට පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක දෙක අයත් වේ.මුළු ජනගහනය 2370075 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක මෙම ජනගහනය පදිංචිව සිටිති. ග්‍රාම සේවා වසම් ගණන 2458 කි. ගම්මාන ගණන 5682 කි. භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 7888 කි. පළාත් පාලන ආයතන ගණන 34 කි.

## 5.1 වගකීම

2015 සැප්තැම්බර් මස 21 දින ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන්_වන ආකාරයට වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීම් දෙකකි. එනම්,

1. වයඹ පළාත තුල ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධිකරණය කිරීම, ඊට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

2. වයඹ සංවර්ධන වැඩසටහන් සම්බන්ධිකරණය සඳහා_ලේකම් කාර්යාලයක් පිහිටුවීම. වයඹ පළාත තුල තුලිත ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීම වයඹ ලේකම් කාර්යාලයේ වගකීමයි.

## 5.2 ප්‍රගතිය 2015

### 5.2.1 වයඹ සංවර්ධන වැඩසටහන් සම්බන්ධිකරණය කිරීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග

1. දැනටමත් රජය විසින් ක්‍රියාත්මක කරමින් පවතින සංවර්ධන ව්‍යාපෘති ලේඛනගත කර, එම සංවර්ධන ව්‍යාපෘති වේගවත් කිරීම උදෙසා අදාළ පාර්ශවයන් සමග සාකච්ඡා කර නිසි විසඳුම් ලබා දීමට ක්‍රියා කරන ලදී. මෙහිදී විශේෂයෙන් වාරිමාර්ග ව්‍යාපෘති, මාර්ග සංවර්ධන ව්‍යාපෘති, පානීය ජල ව්‍යාපෘති හා නගර සංවර්ධන ව්‍යාපෘති වලට විශේෂ ස්ථානයක් ලබා දෙන ලද අතර මෙම එක් එක් ක්ෂේත්‍ර වලට අදාලව සාකච්ඡා/ ප්‍රගති සමාලෝචන රැස්වීම් අදාල විෂයය ක්ෂේත්‍ර වල නිලධාරීන් සමග පවත්වන ලදී.

2. වයඹ ලේකම් කාර්යාලය කුරුණෑගල නගරය තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලයක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ගන්නා ලදී. එම කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් අතිරේක ලේකම්වරයෙකු පත් කිරීමට ද කටයුතු කරනු ඇත.මහ ලේකම් කාර්යාල සඳහා_අවශ්‍ය ගොඩනැගිලි පහසුකම්ද මේ වන විට සපුරා ගෙන ඇති අතර මෙම කාර්යාලය ස්ථාපිත කල පසුව අදාල රේඛීය අමාත්‍යාංශ හා පලාත් සභා ආයතන සම්බන්ධ කර ගනිමින් සම්බන්ධිකරණ යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත.

### 5.2.2 ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමට අදාලව ගෙන ඇති ක්‍රියාමාර්ග

1. අමාත්‍යාංශය ස්ථාපිත කර කෙටි කාලයක් ඇතුළත ක්ෂේත්‍ර 10කට අදාළව ව්‍යාපෘති ව්‍යාපෘති යෝජනා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදි. එම යෝජනා ද සැලකිල්ලට ගෙන 2016 වාර්ෂික අය-වැය ඇස්තමේන්තු වලින් රුපියල් මිලියන 2500ක ප්‍රතිපාදන වයඹ සංවර්ධන අමාත්‍යාංශයට වෙන්කර දී ඇත.

2. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ වයඹ සංවර්ධනය වෙනුවෙන් අදහස්, යෝජනා හා ව්‍යාපෘති වාර්තා ලබා ගැනීම සඳහා ජාතික පුවත්පත් හරහා විවෘත ආරාධනයක් සිදු කරන ලදි.

3. ඊට අතිරේක වශයෙන් ප්‍රාදේශීය සභා ගම් මට්ටමේ නිලධාරීන් හා මහජන සංවිධාන වල අදහස් වාචිකව ලබා ගැනීමේ වැඩසටහනක් ද අමාත්‍යාංශය විසින් දියත් කරන ලදී.

4. අවසන් අදියරේ දී මෙම සියළු යෝජනා හා අදහස් ඒ ඒ ක්ෂේත්‍රවල විද්වතුන්, ක්ෂේත්‍ර ප්‍රවීණයන් හා මහජන නියෝජිතයන් සහභාගි වන වැඩමුළුවකදී සාකච්ඡා කර වයඹ පලාත වෙනුවෙන් සියළු ක්ෂේත්‍ර ආවරණය වන ආකාරයට පස් අවුරුදු සංයුක්ත සැලැස්මක් සකස් කරන අතර ක්‍රියාත්මක කිරීමේ ආයතන හරහා ක්‍රියාවට නංවනු ලැබේ.

   කෙටි කාලීන සැලසුමක් ලෙස 2016 වර්ෂය වෙනුවෙන් ක්ෂේත්‍ර 10 ක් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී.

   එම ව්‍යාපෘති 10 මෙසේය.

   1. සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
   2. වයඹ පානීය ජල ව්‍යාපෘතිය
   3. වයඹ වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම
   4. ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
   5. ධීවර සංවර්ධන ව්‍යාපෘතිය
   6. වයඹ ආර්ථික කලාප ඇති කිරීම
   7. කුඩා නගර සංවර්ධනය
   8. කෘෂිකාර්මික පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
   9. ස්වයං රැකියා ව්‍යාපෘතිය
   10. රැකියා ප්‍රවර්ධන ව්‍යාපෘතිය

# 6. සංස්කෘතික ප්‍රවර්ධනය

## 6.1 සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන

### I. සංස්කෘතික මධ්‍යස්ථාන පාඨමාලා

2015.12.31 වන විට දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන 177 ක් පිහිටුවා ඇත. මෙම සංස්කෘතික මධ්‍යස්ථාන මගින් උඩරට, පහතරට,සබරගමු සහ ජන නැටුම්, පෙරදිග සහ අපරදිග සංගීතය, නාට්‍ය හා රංග කලාව, චිත්‍ර, මූර්ති සහ කැටයම් කලාව, කායික හා මානසික වර්ධනය, අත්කම් නිපැයුම් හා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාවන් ද පාලි හා සංස්කෘතික භාෂාවන් යන පාඨමාලා නොමිලේ පවත්වනු ලැබේ.

**2015 වර්ෂයේ සංස්කෘතික මධ්‍යස්ථාන වලින් පුහුණුව ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව - 45,917කි.**

### II. ජාතික සහ ප්‍රාදේශීය සංස්කෘතික වැඩසටහන් සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන දායකත්වය

සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ප්‍රදේශයේ සෑම වයස් කාණ්ඩයකම සහභාගීත්වයෙන් සහ ප්‍රදේශයේ අනුග්‍රාහකයන්ගේ දායකත්වයෙන් සාරධර්ම පිරි සමාජයක් බිහිකිරීම අරමුණු කරගෙන වාර්ෂිකව නිදහස් උත්සවය,අලුත් අවුරුදු උත්සවය, සාහිත්‍ය කලා මහෝත්සවය, ආගමික හා වෙනත් සංස්කෘතික උත්සව ආදී ජාතික උත්සවවලට සමගාමීව ප්‍රාදේශීය වශයෙන් ද උත්සව පවත්වනු ලබයි. .

### III. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සේවාව

සංස්කෘතික මධ්‍යස්ථාන ආශ්‍රිත ග්‍රාමීය ජනතාවගේ හා සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලා හැදෑරීම සඳහා පැමිණෙන සිසුන්ගේ කියවීමේ පුරුද්ද සහ සාහිත්‍ය රසවින්දන හැකියාව දැනුම අවබෝධය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන පුස්තකාල සේවය ක්‍රියාත්මක කරනු ලබයි.

පසුගිය වසරේ ප්‍රකාශයට පත් කරන ලද වැදගත් සාහිත්‍ය කෘති අතුරින් කමිටුවක් මගින් තෝරා ගනු ලබන (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්) පොත් කට්ටලයක් වාර්ෂිකව දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සඳහා බෙදා දෙනු ලැබේ. 2015 වර්ෂයේදී රු.9,389,975.00ක වියදමින් පොත් 40,035 ක් මිලදී ගෙන සංස්කෘතික මධ්‍යස්ථාන අතර බෙදා හරින ලදී.

**සංස්කෘතික මධ්‍යස්ථාන තුළ පිහිටුවා ඇති පුස්තකාල පාඨක සංඛ්‍යාව(ජංගම පුස්තකාල පාඨක සංඛ්‍යාව ද ඇතුළත්ව) - 2015 – 48,652**

**ප්‍රවාහන අපහසුතා පවතින ප්‍රදේශවල පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානවල ත්‍රී රෝද රථ හා පාපැදි මගින් ජංගම පුස්තකාල සේවයක් ක්‍රියාත්මක කරනු ලබයි.**

2015 වර්ෂයේ ජංගම පුස්තකාල සේවය ක්‍රියාත්මක කල සංස්කෘතික මධ්‍යස්ථාන ගණන 24ක් වන අතර පාඨක සංඛ්‍යාව 2168 කි.

| පළාත | සංස්කෘතික මධ්‍යස්ථානය | | ජංගම පුස්තකාල පාඨක සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 01 | පානදුර | 20 |
| දකුණ | 02 | බෙලිඅත්ත | 30 |
| | 03 | පස්ගොඩ | 20 |
| | 04 | දික්වැල්ල | 36 |
| | 05 | අකුරැස්ස | 32 |
| මධ්‍යම | 06 | පාතදුම්බර | 50 |
| | 07 | යටවත්ත | 63 |
| සබරගමුව | 08 | කෑගල්ල | 650 |
| | 09 | රුවන්වැල්ල | 100 |
| | 10 | බලංගොඩ | 130 |
| වයඹ | 11 | පුත්තගම | 18 |
| | 12 | මහවැව | 250 |
| | 13 | ආණමඩුව | 42 |
| | 14 | කරුවලගස්වැව | 40 |
| | 15 | ගල්ගමුව | 02 |
| | 16 | වාරියපොළ | 03 |
| | 17 | මල්ලවපිටිය | 15 |
| | 18 | අලව්ව | 15 |
| | 19 | ගිරිබාව | 100 |

| පළාත | සංස්කෘතික මධ්‍යස්ථානය | | ජංගම පුස්තකාල පාඨක සංඛ්‍යාව |
|---|---|---|---|
| | 20 | මහව | 147 |
| ඌව | 21 | පස්සර | 27 |
| උතුරු මැද | 22 | නොච්චියාගම | 75 |
| උතුර | 23 | මඩුකන්ද | 300 |
| | 24 | උඩුවිල් | 03 |
| **මුළු ජංගම පුස්තකාල පාඨක සංඛ්‍යාව** | | | **2168** |

## IV. දේශීය නර්තන ශිල්පී සංචිතය

සංස්කෘතික මධ්‍යස්ථාන වලින් නර්තන පාඨමාලා මැනවින් හදාරා දක්ෂතා පෙන්වන ලද ශිල්පීන්ගෙන් සමන්විත නර්තන සංචිතයක් 2015 වර්ෂයේ දී ද පවත්වා ගෙන යන ලදී.

| නර්තන අංගය | ශිල්පීන් ගණන | |
|---|---|---|
| | නර්තන ඇඳුම් /භාණ්ඩ සහිතව | නර්තන ඇඳුම් /භාණ්ඩ රහිතව |
| වෙස් නැටුම් | 500 | 1,000 |
| ශාස්ත්‍රීය කාන්තා | 300 | 1,000 |
| **පහතරට නර්තන අංග** | | |
| පහතරට නැටුම් කාන්තා | 100 | 400 |
| තෙල්මේ | 50 | 450 |
| කෝලම්, සන්නි හා පාලි - වර්ග 03 | 60 | 200 |
| සබරගමු නැටුම් - කාන්තා | 200 | 400 |
| සබරගමු නැටුම් - පිරිමි | 100 | 250 |
| ගැමි නර්තන අංග 20 ක් හා කණ්ඩායම් 25 කින් යුක්තය | | |
| | ශිල්පීන් 40 බැගින් සිටින කණ්ඩායම් 12 | කණ්ඩායම් 50 |
| බෙර වාදන ශිල්පීන් | 1,500 | 2,000 |

## 6.2. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය දායකත්වය දැක් වූ ජාතික වැඩසටහන් සහ පවත්වන ලද විශේෂ වැඩසටහන්

| දිනය | වැඩසටහන හා පැවැත්වූ ස්ථානය | අමාත්‍යාංශයේ දායකත්වය / සහභාගීත්වය |
|---|---|---|
| 2015.02.04 | ජාතික නිදහස් දින උත්සවය - සංස්කෘතික පෙරහැර - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ. | එක් අංගයක් සඳහා නර්තන ශිල්පීන් 52 බැගින් වන නර්තන කණ්ඩායම් 10 ක් පෙරහැර සඳහා දායකත්වය සැපයීය. මේ සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා තරගාවලියෙන් ජයග්‍රහණය ලද සංස්කෘතික මධ්‍යස්ථාන ශිල්පීන් සහභාගී වන ලදී. |
| 2015.03.02 | වාරියපොල සුමංගල හිමි ගුණානුස්මරණ වැඩසටහන - වාරියපොල ශ්‍රී සුමංගල පිරිවෙන් භූමිය. | ගරු ජනාධිපතිතුමා පිළිගැනීම හා පෙරහැර සඳහා නර්තන ශිල්පීන් 50 ක් සහභාගී කරන ලදී. |
| 2015.03.10 | ලෝක කාන්තා දින සැමරුම් උළෙල - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව. | ශිල්පීන් 20 කගෙන් යුත් වෙස් නර්තන කණ්ඩායමක් සහභාගී කරන ලදී. |
| 2015.03.13 | ලංකාවට පැමිණි ඉන්දීය අගමැති පිළිගැනීම - කටුනායක ගුවන් තොටුපල | නර්තන හා බෙර වාදන ශිල්පීන් 300ක් සහභාගී කරන ලදී. |

| දිනය | වැඩසටහන හා පැවැත්වූ ස්ථානය | අමාත්‍යාංශයේ දායකත්වය / සහභාගීත්වය |
|---|---|---|
| 2015.03.24 | ලංකාවට පැමිණි කටාර් එමීර්වරයා පිළි ගැනීම- ගෝල්ෆේස් පිටිය | නර්තන හා බෙර වාදන ශිල්පීන් 300 ක් සහභාගී කරන ලදී. |
| 2015.03.31 | සෙනෙහස ජාතික වැඩසටහන- මාතලේ මුත්තුකමාරි අම්මාන් දේවස්ථානය.<br><br>ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන මට්ටමින් ද සෙනෙහස වැඩසටහන පවත්වන ලදී. | ගර්භණී මාතාවන් 1300ක් පමණ ද පියවරුන් 250 ක් පමණ ද සහභාගී විය.දරු නැලවිලි ගී, නර්තනාංග හා රිද්දියාගය ඇතුලත් ගී රසවින්දන වැඩසටහනක් පවත්වන ලද අතර සෑම මවකටම ළදරු කුඩයක්, චීත්තයක්, නැප්කින් හා පලතුරු වට්ටියක් සහිත ත්‍යාග පාර්සලයක් හා දිවා ආහාර ලබා දෙන ලදී. |
| 2015.03.23 | “සෙනෙහස” වැඩසටහන - සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | රාජ්‍ය සේවයේ නියුතු මව්වරුන් 100 ක් සහභාගී වූ අතර ඉහත වැඩසටහනම මෙහිදී පවත්වන ලදී. |
| 2015.04.05 | ස්වර්ණවාහිනී මාධ්‍ය ආයතනය හා අමාත්‍යාංශය ඒකාබද්ධව පැවැත්වූ නව අවුරුදු උළෙල- මාතලේ | ශිල්පීන් 200 කගෙන් සමන්විත නර්තන කණ්ඩායමක් සහභාගී කරවන ලදී. |
| 2015.04.07 | අලුත් අවුරුදු නැකැත් සීට්ටුව අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වීම හා දිවයින පුරා බෙදා හැරීම. | අලුත් අවුරුදු නැකැත් සීට්ටුව අතිගරු ජනාධිපතිතුමන් වෙත ජනපති නිල නිවසේදී පිළිගන්වන ලදී. අලුත් අවුරුදු නැකැත් සීට්ටු 155,000ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දිවයින පුරා බෙදා හැරීම ද සිදු කරන ලදී. |
| 2015.04.10 | භූතාන අගමැති පිළිගැනීම - ජනාධිපති ලේකම් කර්යාලය | නර්තන හා බෙර වාදන ශිල්පීන් 300ක් සහභාගී කරන ලදී. |
| 2015.04.23 | අවුරුදු උත්සවය - ශාන්තාලෝකගම,කඩුවෙල | මෙම අවුරුදු උත්සවය නැගම් යාම වැනි සිංහල සිරිත් විරිත් වලින් ද, ඔළිඳ කෙළිය, පංචා දැමීම, දාන් ඇදීම, අඹ ඇට පැනීම, පොර පොල් ගැසීම,රබන් ගැසීම, කතුරු ඔංචිල්ලා ආදී ජන ක්‍රීඩා ආදියෙන් ද ජන නැටුම් වලින්ද සමන්විත වූ අතර මේ සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය හා සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල හා සිසු සිසුවියන් සහභාගී වූහ. |
| 2015.05.02 | දෙනිපිටිය ගංගාතිලක විහාරයේ සර්වඥ ධාතු ප්‍රදර්ශනය | හේවිසි ශිල්පීන් 50ක් සහභාගී කරවන ලදී. |
| 2015.05.03 | රාජ්‍ය වෙසක් උත්සවය - මහියංගනයි | සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන සංචිතයේ ශිල්පීන් විසින් වෙස්සන්තර මුද්‍රා නාට්‍ය ඉදිරිපත් කරන ලදී. |
| 2015.05.02-05 | ගංගාරාමය- බුද්ධ රශ්මි වෙසක් කලාපය | එදින ප.ව. 7.30 සිට මධ්‍යම රාත්‍රී 1.30 තෙක් රාජ්‍ය නැටුම් කණ්ඩායම් ශිල්පීන් ඇතුළුව සංස්කෘතික මධ්‍යස්ථාන 08ක නර්තන කණ්ඩායම් 16ක් සහ බෞද්ධ බැති ගී කණ්ඩායම් 16ක සහභාගීත්වයෙන් ප්‍රසංග පවත්වන ලදී. |
| 2015.06.01-07 | රාජ්‍ය පොසොන් උත්සවය - මාතලේ අලු විහාරය | සර්වඥ ධාතු හා දුටුගැමුණු හෂ්මාවශේෂ ප්‍රදර්ශනය, පොසොන් තොරණ, භක්ති ගීත තරඟ, කූඩු තරඟ හා ප්‍රදර්ශ, රූකඩ ප්‍රදර්ශන, චිත්‍ර ප්‍රදර්ශන, රූකඩ ප්‍රදර්ශන, චිත්‍රපට ප්‍රදර්ශන, සම්ප්‍රදායික ශාන්තිකර්ම, පෙරහැර, පිණ්ඩපාත චාරිකා වැඩසටහන, භක්ති ගීත හා නර්තන ප්‍රසංග පවත්වන ලදී. |

| දිනය | වැඩසටහන හා පැවැත්වූ ස්ථානය | අමාත්‍යාංශයේ දායකත්වය / සහභාගීත්වය |
|---|---|---|
| 2015.06.02 | තන්තිරිමලේ රූපවාහිනී පොසොන් කලාපය | සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන සංචිතයේ ශිල්පීන් විසින් මුද්‍රා නාට්‍යක් ඉදිරිපත් කරන ලදී. |
| 2015.06.02 | තිස්සමහාරාමය | තිස්සමහාරාම පෙරහැර සඳහා නර්තන කණ්ඩායම් 10ක් සහභාගි කරවන ලදී. |
| 2015.06.06 | කොරතොට රජ මහා විහාරයේ දොරකඩ අස්න පෙරහැර | නර්තන හා බෙර වාදන ශිල්පීන් 100ක් සහභාගී කරවන ලදී. |
| 2015.06.20 | මොරගහහේන, පූර්වාරාමයේ පෙරහැර | ශිල්පීන් 24 දෙනෙකුගෙන් යුත් වෙස් නර්තන කණ්ඩායමක් සහභාගී කරවන ලදී |
| 2015.10.21 | සිත්තම්ගල්ලෙන | සිත්තම්ගල්ලෙන විහාරස්ථාන පෙරහැර සඳහා නර්තන කණ්ඩායම් 05 ක් ලබා දෙන ලදී. |
| 2015.11.18 | කසාගල රජ මහා විහාරය | ඓතිහාසික කසාගල රජමහා විහාරස්ථ පෙරහැර සඳහා නර්තන කණ්ඩායම් 08 ක් සහභාගි කරවන ලදී. |
| 2015.11.29 | වාරියපොළ ශ්‍රී සුමංගල විද්‍යාලය | ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී උත්සවයට සමගාමීව දේශමාන්‍ය හා වයඹ පළාත් කලාකරුවන් 30 දෙනෙකුට සම්මාන ප්‍රදානය කිරීම. |
| 2015.12.30 | අමාත්‍යාංශය | නත්තල් සැමරුම් උත්සවය |

### 6.3 ප්‍රතිභා සම්මාන හා සහතික ප්‍රදානය

සංස්කෘතික මධ්‍යස්ථාන 172ක සංගීතය, නර්තනය, රංගනය ආදී සෞන්දර්යාත්මක විෂයයන් හදාරණ සිසුන් තුළ විෂය ප්‍රගුණ කර ශිල්ප දැක්වීමට අවස්ථාවක් ලබාදීමත්, සෞන්දර්යාත්මක චරිත සංවර්ධනය හා පෞරුෂ ගුණාංග වර්ධනයත්, දේශීය සංස්කෘතිකාංග ආරක්ෂා කර ගැනීමත්, අරමුණු කර ගෙන අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත, නර්තන, රංගන තරඟාවලිය වාර්ෂිකව "ප්‍රතිභා" නමින් පවත්වනු ලැබේ. සෑම අංශයකින්ම ඉහල දක්ෂතා පෙන්නුම් කරන කණ්ඩායම් ඉදිරිපත් වූ මධ්‍යස්ථානයට ශූරතාවය හා අනුශූරතාවය ප්‍රදානය කෙරේ. ඒ අනුව 2015 ප්‍රතිභා ශූරතාව මාතර නූපේ සංස්කෘතික මධ්‍යස්ථානයත් අනුශූරතාව වැලිගම සංස්කෘතික මධ්‍යස්ථානයත් දිනා ගන්නා ලදී.

### 6.4 අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය

2002 වර්ෂයේ සිට වසරක් පාසා රාජ්‍ය සේවකයින්ගේ නිර්මාණාත්මක කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ හා ඔවුන් උනන්දු කිරීමේ අරමුණින් කෙටි කතා, ළමා කතා, ගීත රචනා, පද්‍ය රචනා, කෙටි නාට්‍ය, කෙටිකතා පරිවර්තන හා චිත්‍ර යන අංශයන්ගෙන් හා සිංහල හා දෙමළ මාධ්‍ය වලින් රාජ්‍ය සේවකයින් අතර තරග පවත්වා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ජයග්‍රාහකයින්ට සහතිකපත් හා මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ. අවසානයේ ජයග්‍රාහී නිර්මාණ ඇතුළත් කර "ප්‍රභාෂ්වර" නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**2015 වර්ෂයේ අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම**

| | තරග අංශය | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය |
|---|---|---|---|
| **1.** | කෙටි කතා | **203** | **71** |
| **2.** | ගීත රචනා | **377** | **68** |
| **3.** | චිත්‍ර | **61** | **12** |
| **4.** | පද්‍ය රචනා | **521** | **128** |
| **5.** | ළමා නිර්මාණ | **60** | **20** |
| **6.** | නාට්‍ය | **60** | **17** |
| | එකතුව | **1282** | **316** |

### 6.5 රසවින්දන වැඩසටහන් පැවැත්වීම

පාසල් ළමයින්ගේ සහ තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක රසවින්දන හැකියාවන් වර්ධනය කිරීම මගින් සංවේදී මිනිසුන්ගෙන් පිරි සමාජයක් බිහිකිරීම අරමුණු කොට තෝරාගත් පාසල් සහ විශේෂ ඉල්ලීම් සිදු කරන ආයතන සඳහා මෙම රසවින්දන වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහිදී අදාළ සෞන්දර්ය හෝ සාහිත්‍ය විෂයෙහි පළපුරුදු සම්පත්දායකයෙකුගේ මූලිකත්වයෙන් මෙම වැඩසටහන් පැවැත්වේ.

2015 වසරේ පවත්වන ලද වැඩසටහන්

| | දිනය | ස්ථානය |
|---|---|---|
| **01** | 2015.02.13 | කැලණිය විශ්වවිද්‍යාලය |
| **02** | 2015.03.08 | බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානය |
| **03** | 2015.03.10 | සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ශ්‍රවණාගාරය |
| **04** | 2015.03.12 | විල්ගමුව සංස්කෘතික මධ්‍යස්ථානය |
| **05** | 2015.03.14 | විල්ගමුව සංස්කෘතික මධ්‍යස්ථානය (නාට්‍ය වැඩමුළුව) |
| **06** | 2015.03.20 | පල්ලේපොල සංස්කෘතික මධ්‍යස්ථානය |
| **07** | 2015.03.21 | පල්ලේපොල සංස්කෘතික මධ්‍යස්ථානය (නාට්‍ය හා රංග කලා වැඩමුළුව) |
| **08** | 2015.03.27 | අඹන්ගඟ කෝරලේ සංස්කෘතික මධ්‍යස්ථානය |
| **09** | 2015.03.28 | අඹන්ගඟ කෝරලේ සංස්කෘතික මධ්‍යස්ථානය (නාට්‍ය හා රංග කලා වැඩමුළුව) |
| **10** | 2015.05.08 | නාඋල සංස්කෘතික මධ්‍යස්ථානය |
| **11** | 2015.05.09 | නාඋල සංස්කෘතික මධ්‍යස්ථානය (නාට්‍ය හා රංග කලා වැඩමුළුව) |
| **12** | 2015.07.12 | පාදුක්ක සංස්කෘතික මධ්‍යස්ථානය |
| **13** | 2015.09.17 | ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **14** | 2015.09.18 | ඌව පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **15** | 2015.09.22 | යටවත්ත වීරපරාක්‍රම විද්‍යාලය හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **16** | 2015.09.29 | හතරලියැද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

මෙම රසවින්දන වැඩසටහන් සඳහා මහජනතාව, විශේෂයෙන් තරුණ පිරිස විශාල වශයෙන් සහභාගි විය.

## 6.6 අස්පර්ෂ උරුම සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### ප්‍රගතිය 2015

**I. ගාල්ල දිස්ත්‍රික්කයේ අස්පර්ෂ උරුම ලේඛනය සකස් කිරීම**

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 පුරා විසිරී ඇති අස්පර්ෂ උරුමයන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ ලේඛනගත කිරීම සිදු කරන ලදී. මේ සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික මධ්‍යස්ථානවල සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින සංස්කෘතික නිලධාරීන් මෙම දත්ත එක් රැස් කිරීමට දායකත්වය සපයන ලදී. මෙම ගාල්ල දිස්ත්‍රික් අස්පර්ෂ උරුම ලේඛණය අමාත්‍යාංශ වෙබ් අඩවිය ඔස්සේ (www.cultural.gov.lk) අන්තර්ජාලයට ද එක් කර ඇත.

**II. මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි අස්පර්ෂ උරුම ලේඛණ සකස් කිරීම**

මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි අස්පර්ෂ උරුමයන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සම්බන්ධ කටයුතු 2014 වර්ෂයේ අවසන් කාර්තුවේ දී ආරම්භ කරන ලද අතර මේ වන විට එහි දත්ත එක් රැස් කිරීමේ කටයුතු අවසන් කර අස්පර්ෂ උරුම ලේඛණ සකස් කිරීම සිදු කරමින් පවතී.

**III. 2016 දී නූල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ අස්පර්ෂ උරුමයක් ලෙස නම් කිරීමට අදාළ නාම යෝජනා පත්‍ර යුනෙස්කෝ සංවිධානයට ඉදිරිපත් කිරීම**

2014 වර්ෂයේදී සිදු කරන ලද විදුම් පිළිස්සුම් වෙදකම, සිංහල හා දෙමළ අලුත් අවුරුදු චාරිත්‍ර, කොටහළු යාගය ශාන්තිකර්ම, ශ්‍රී දළදා පෙරහැර හා නූල් රූකඩ කලාව යන අස්පර්ෂ උරුමයන් පිළිබඳ අධ්‍යයනවල අධ්‍යයන වාර්තා පරීක්ෂා කිරීමෙන් පසුව නූල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ අස්පර්ෂ උරුමයක් ලෙස නම් කිරීමට සලකා බැලීමට තෝරා ගෙන ඇත. මීට අදාළ නාම යෝජනා පත්‍ර සකස් කර 2015 මාර්තු මස යුනෙස්කෝ සංවිධානයට භාරදෙන ලදී.

## 6.7 ජන සංගීත සංරක්ෂණ ව්‍යාපෘතිය

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් නවීන පරිගණක තාක්ෂණික උපකරණ පද්ධතියකින් සමන්විත ජන සංගීත සංරක්ෂණ පුස්තකාලයක් 2010 සැප්තැම්බර් 23 වන දින ආරම්භ කරන ලදී. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන නෝර්වේජියානු රජය විසින් සලසා දී ඇත.

**අරමුණ -** ශ්‍රී ලාංකික ජන ජීවිතය සමග ඒකාබද්ධව, අනාදිමත් කාලයක සිට පැවතෙමින් තිබෙන ජන ගායනා, ඒවායේ නාද මාලා, හේවිසි, වන්නම්, පූජා, යාතු කර්මවල එන නාදමාලා ආදී ජන උරුමයන් අභාවයට යා නොදී ආරක්ෂා කර එය අනාගත පරපුරට දායාද කිරීමත්, ඒවා ජනතාවගේ ජීවිතයට බද්ධ කරලීම මගින් ජනතාවගේ රසවින්දන ශක්තීන් පුළුල් කිරීමත් විවිධ සම්ප්‍රදායන්ට අයත් මෙරට ජන සංගීත කලාංග හා ඒවායේ නාදමාලා සංරක්ෂණයත් මෙහි අරමුණ වේ.

**මූලික කාර්යයන්**

දැනට රටේ විවිධ ප්‍රදේශවල මහජනයා සතුව සහ විවිධ ආයතන සතුව විසිරී පවතින ඉහත සඳහන් කලාංග සොයා ගොස් තොරතුරු ඒකරාශී කිරීම, එම තොරතුරු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පටිගත කිරීම සහ සංරක්ෂණය කිරීම, අධ්‍යයන සහ පර්යේෂණ අවශ්‍යතාවන් උදෙසා ප්‍රතිලාභීන්ට භාවිතයට ඉඩ ලබාදීම හා ඉහත දැනුම සමාජගත කිරීමට අවශ්‍ය ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම.

### 2015.12.31 වන විට ජන සංගීත සංරක්ෂණ පුස්තකාලයේ සමස්ත ප්‍රගතිය

තාක්ෂණික පහසුකම්

- ක්ෂේත්‍රගත ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් සඳහා EX 1 R වර්ගයේ කැමරාවක්.
- විදුලි ලාම්පු 1 Kv 03 ක්
- බූම් මයික්‍රොෆෝන් 02 ක්

- සංස්කරණ මැදිරිය සඳහා දෘශ්‍ය සංස්කරණ පරිගණකය.
- ශ්‍රව්‍ය සංස්කරණ පරිගණකය ඇතුළු උපාංග
- සියලු දත්තයන් සංරක්ෂණය කිරීමට සර්වර් පරිගණකයකින් සමන්විතය
- සර්වර් පරිගණකයට සම්බන්ධ කරන ලද පරිගණක 03 ක ආධාරයෙන් ප්‍රතිලාභීන් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය අංග ශ්‍රවණයට හා නැරඹීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම්වලින් සමන්විතය.

**තොරතුරු එක්රැස් කිරීම**

- ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් හා සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය හරහා ප්‍රාදේශීය කලාකරුවන්ගේ තොරතුරු වාර්තා කරගැනීම සිදුකරනු ලැබේ.
- 2015 සිට උතුරු නැගෙනහිර ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ජන සංගීතාංග පිළිබඳ තොරතුරු රැස් කිරීම ද සිදු කරනු ලැබේ.

**මහජනතාවට තොරතුරු ලබාදීම**

සංරක්ෂණය කෙරෙන ශ්‍රව්‍ය දෘෂ්‍ය දත්ත පිළිබඳව උනන්දුවක් දක්වන අයට (විශ්වවිද්‍යාල ගුරුවරු හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්, පාසැල් ගුරුවරු හා ළමුන්, නිර්මාණකරුවන් හා වෙනත්) ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය වෙත පැමිණ පරිගණක ආධාර කර ගනිමින් අවශ්‍ය නාද මාලා ශ්‍රවණයට හා නැරඹීමට අවස්ථාව හිමි ය. ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මගින් අධ්‍යාපන හා නිර්මාණාත්මක කටයුතු සඳහා මහජනතාව ට කිසියම් ජන සංගීත අංගයකින් ශ්‍රව්‍ය දෘශ්‍ය පිටපත් ලබා ගැනීමේ හැකියාව ද පවතී. ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය විසින් වෙනත් ආයතන සමග පවත්වනු ලබන ප්‍රවර්ධන වැඩසටහන්වලදී තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.

**ජන සංගීත සංරක්ෂණ පුස්තකාලයේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව මෙහෙයවීමට උපදේශක මණ්ඩලයක් පත් කිරීම**

ජන සංගීත සංරක්ෂණ පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු මෙහෙයවීම, ක්ෂේත්‍රගත පටිගත කිරීම් හා ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම ඇතුළු කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ගුණාත්මකව මෙහෙයවීම සඳහා ජන සංගීතය හාසම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, සංගීත අධ්‍යක්ෂවරුන් හා පර්යේෂකයන්ද , ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහ රූපවාහිනී සංස්ථාවේ සම්පත්දායකයන් ද ඇතුළත්වන පරිදි උපදේශක මණ්ඩලයක් පත්කර ඇත.

**2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ශ්‍රව්‍ය දෘෂ්‍ය පටිගත කිරීම්වල ප්‍රගතිය**

| මාසය | ජන සංගීත අංගය | ස්ථානය |
|---|---|---|
| ජනවාරි | ➢ කොහොඹායක් කංකාරි ශාන්තිකර්මය ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම<br>➢ හෙළ ගී මංගල්ලේ ජන ගී ප්‍රසංගය පටිගත කිරීම | කොළඹ විශ්වවිද්‍යාලය<br>නාමෙල් මාලනී පුංචි තියටර් |
| පෙබරවාරි | ➢ ජහුටා ගැමි නාටකය පටිගත කිරීම | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| මාර්තු | ➢ සබරගමු සම්ප්‍රදායේ ගී මඩු ශාන්තිකර්මය පටිගත කිරීම<br>➢ 2015 තෙක් සිදු කළ පටිගත කිරීම්වල දත්ත සංරක්ෂණය කිරීම<br>➢ රෝහණ බැද්දගේ මහතා සමග ජන සංගීත ආදර්ශ ගායනා මැදිරි පටිගත කිරීම | රත්නපුර - කලවාන<br>සංස්කරණ මැදිරිය<br>ටවර්හෝල් ශබ්දාගාරය |
| අප්‍රේල් | ➢ සුවිසි විවරණ නෘත්‍ය පූජාව පටිගත කිරීම<br>➢ අවුරුදු උත්සවයේ ජන කෙළි සෙල්ලම් පටිගත කිරීම<br>➢ අවුරුදු උත්සවය පිළිබඳ කෙටි වීඩියෝ වැඩසටහනක් නිෂ්පාදනය කර අන්තර්ජාලයට මුදා හැරීම | කුරුණෑගල - ඕගොඩපොළ<br>කඩුවෙල - ශාන්තාලෝකගම<br>සංස්කරණ මැදිරිය |

| මාසය | ජන සංගීත අංශය | ස්ථානය |
|---|---|---|
| මැයි | ➢ උඩරට සම්ප්‍රදායේ කොහොඹායක් කංකාරි ශාන්තිකර්මයේ පූර්ව චාරිත්‍ර පටිගත කිරීම<br>➢ බදුල්ල සම්ප්‍රදායික කරත්ත ගමනාගමනය සම්බන්ධව වීඩියෝ වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරීම හා එය සංස්කෘතික මධ්‍යස්ථානයට ලබා දීම<br>➢ අපේ ගම සංස්කෘතික අධ්‍යාපන ප්‍රදර්ශනය පටිගත කිරීම<br>➢ යාපනය සංගීත උළෙල සහ බාහිර පටිගත කිරීම් සිදු කිරීම | මහබාගේ ප්‍රදේශය<br>සංස්කරණ මැදිරිය<br>ස්ප්‍රිංවැලි සංස්කෘතික මධ්‍යස්ථානය<br>යාපනය නගරසභා පිටිය<br>යාපනය, සංකානෙයි, මුලතිව් ඇතුළු තදාසන්න ප්‍රදේශ |
| ජුනි | ➢ ජනශ්‍රැති පර්යේෂක අමරදාස වීරසිංහ මහතාගේ සම්මුඛ සාකච්ඡාව පටිගත කිරීම<br>➢ වේයන්ගොඩ පැවති කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ සංස්කරණ කටයුතු | බෙල්ලන්විල විහාර පරිශ්‍රය<br>සංස්කරණ මැදිරිය |
| ජූලි | ➢ වේයන්ගොඩ පැවති කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ සංස්කරණ කටයුතු<br>➢ දකුණු කොරියා ICHCAP ආයතනය සමග ඇනලොග් දත්ත ඩිජිටල් කිරීමේ ව්‍යාපෘතිය සාකච්ඡා කිරීම හා දත්ත රැස් කිරීම, වර්ග කිරීම හා පරිගණකගත කිරීම | සංස්කරණ මැදිරිය<br>සංස්කරණ මැදිරිය |
| අගෝස්තු | ➢ අධ්‍යාපන අමාත්‍යාංශය සමග රසවින්දන වැඩසටහන් මාලාවක් පැවැත්වීමට සාකච්ඡාවක් පැවැත්වීම සහ ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට තොරතුරු වාර්තා කර ගැනීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| සැප්තැම්බර් | ➢ මාතර සම්ප්‍රදායේ දහඅට සන්නිය හා කෝලම් මඩුව පටිගත කිරීම | ගාල්ල, කොග්ගල |
| ඔක්තෝම්බර් | ➢ දහඅට සන්නිය හා කෝලම් මඩුව සංස්කරණ කටයුතු | සංස්කරණ මැදිරිය |
| නොවැම්බර් | ➢ 2015 ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී උළෙලේ කලාංග පටිගත කිරීම<br>➢ ICHCAP ආයතනය සහ මෙම අමාත්‍යාංශය අතර අත්සන් කිරීමට යෝජනා වූ ගිවිසුම, නීතිපති උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව ට යොමු කිරීම හා ඒ පිළිබඳව සාකච්ඡා කිරීම | වාරියපොළ ශ්‍රී සුමංගල ජාතික පාසල<br>නීතිපති දෙපාර්තමේන්තුව |
| දෙසැම්බර් | ➢ 2015 රාජ්‍ය සංගීත උළෙලේ විශේෂ සම්මානලාභී කලාකරුවන්ගේ කෙටි වීඩියෝ වාර්තා වැඩසටහන සඳහා පටිගතකිරීම් සිදු කිරීම සහ වැඩසටහන සංස්කරණයකර නිර්මාණය කිරීම<br>(අමරා රණතුංග, ලතා වල්පොල, බ්‍රිජට් හල්පේ, පද්මසිරි මෙන්ඩිස්, ස්ටැන්ලි එම්. ප්‍රනාන්දු, ප්‍රේමදාස මුදුන්කොටුව, තිස්සසිරි පෙරේරා, වික්ටර් රත්නායක, සුමතිපාල පෙරේරා, සුනිල් ආරියරත්න, නන්දා පෙරේරා, ඒ. රගුනාදන්) | නුවර, අතුරුගිරිය, මාලඹේ, පානදුර, වාද්දුව, මොරටුව, දෙහිවල, මඩපාත, පන්නිපිටිය, නුගේගොඩ, වැබඩ, වැල්ලවත්ත |

**ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය මගින් පවත්වන ලද වෙනත් විශේෂ වැඩසටහන්**

- ➢ අධ්‍යාපන අමාත්‍යාංශය සමග රසවින්දන ව්‍යාපෘතියක් ඉදිරියේ දීපැවැත්වීමට අදාළව සාකච්ඡාවක් පැවැත්වීම.

- අස්පර්ශ උරුමයන් අඩංගු ඇනලොග් තාක්ෂණයෙන් යුතු දත්ත ඩිජිටල් මාධ්‍යයට හැරවීමේ ව්‍යාපෘතියේ මූලික අදියරේ කටයුතු (කැසට්පට, ස්පූල්ස් එක් රැස් කිරීම හා වර්ග කිරීම)
- ඩිජිටල් සංරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව කාර්යමණ්ඩලයට පුහුණුවක් ලබාදීම
- තාක්ෂණික ඇගයුමක් සිදු කිරීම සහ අලුතින් මිලට ගත යුතු උපකරණවලට පිරිවිතර සකස් කර ප්‍රසම්පාදන අංශයට භාර දීම.

## 6.8 මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක තුළ ජීවත්වන බෙර වාදන ශිල්පීන් පිළිබඳ අධ්‍යයනය

ශ්‍රී ලාංකේය සමාජ වපසරිය තුළ මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක ආශ්‍රිතව බිහිවී ඇති බෙර වාදන ශිල්පීන් හා ඔවුන්ගේ සමාජ වපසරිය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි.

මේ පිළිබඳ දත්ත එක්රැස් කිරීම පිළිබඳ පුහුණුවක් සංස්කෘතික මධ්‍යස්ථාන නිලධාරීන්ට 2014 ඔක්තොම්බර් 18,19 යන දෙදින තුළ පවත්වා ඔවුන් මගින් මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික් බෙර ශිල්පීන්ගේ දත්ත 2014 ඔක්තොම්බර් සිට 2015 මාර්තු කාල සීමාව තුළ එක් රැස් කරන ලදී.

පර්යේෂණ නියැදිය - ශිල්පීන් 51
- සියල්ලන්ම සිංහල බෞද්ධයන් වේ.
- පුරුෂ - 50 කාන්තා - 01
- පාරම්පරික ශිල්පීන් - 34 පාරම්පරික නොවන ශිල්පීන් ගණන - 17
- වයස 20 - 30 අතර පිරිස -10
- වයස 30 - 50 අතර පිරිස -16
- වයස 50 - 60 අතර පිරිස -05
- වයස 60ට වැඩි පිරිස - 19
- බෙර වර්ග 01ට වැඩි ප්‍රමාණයක් වාදනය කිරීමේ හැකියාව ඇති ශිල්පීන් - 31
- බෙර වාදන ශිල්පය උගැන්වීමේ නිරත පිරිස - 40
- දළදා පෙරහැරට බෙර වාදනයෙන් දායකත්වය දක්වන ශිල්පීන් - 43

**හඳුනාගත් කරුණු**

බෙර වාදන ශිල්පීන්ගෙන් වැඩිදෙනෙක්
- බෙර වාදන ශිල්පය පිළිබඳ ශිල්පීය දක්ෂතාවයන්ගෙන් යුත් ශිල්පීන් වේ.
- බෙර වාදන ශිල්පය ආශ්‍රිත රැකියාවක නිරතව සිටී.
- බෙර වාදන ශිල්පය නව පරපුරට උගැන්වීමේ නියැලී සිටී.
- ශිල්පයේ ඉතිහාසය පිළිබඳ ප්‍රමාණවත් දැනුමකින් යුක්ත වේ.
- ශිල්පීය චාරිත්‍ර ගෞරවයෙන් යුතුව ඉටු කරයි.

**පවතින ගැටළුකාරී තත්ත්වයන්**
- බෙර වාදන ශිල්පීන්ට සමාජයීය පිළිගැනීම අඩුවීම හේතුවෙන් නව පරපුර බෙරවාදන ශිල්පයට යොමු වීමේ ප්‍රවණතාවය අඩුවීම
- බෙර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යවල මිල වැඩිවීම හේතුවෙන් වාදන භාණ්ඩ සපයා ගැනීමේ දුෂ්කරතාවය
- බෙර වාදන ශිල්පීන්ට ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවීම

ඉදිරියේදී අනිකුත් දිස්ත්‍රික්කවල ද මෙම අධ්‍යයනය සිදුකර “බෙර වාදන ශිල්පය” යන පාරම්පරික අස්පර්ෂ උරුමය ආරක්ෂා කිරීමටත්, එම ශිල්පීන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් වැඩසටහන් රාජ්‍ය මට්ටමින් ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂිත ය.

## 6.9 ශ්‍රී ලංකා ජාතික ලේඛක සංවිධානය

ලේඛකයින් සතු වටිනා නිර්මාණ රාජ්‍ය අනුග්‍රහය යටතේ මුද්‍රණය කරමින්, ජනතාවට හරවත් කෘති පරිශීලනයට අවස්ථාව උදාකර නැණවත් සමාජයක් බිහි කිරීමට හා ඔවුන්ගේ සුභසාධන කටයුතු සඳහා යම් දායකත්වයක් ලබාදීම ලේඛක සංවිධානය පිහිටුවීමේ අරමුණ වේ.

දිස්ත්‍රික් ලේඛක සංවිධානය ප්‍රතිසංවිධානය කිරීමත් ජාතික සංවිධාන නායකවරයකු පත් කිරීමත් 2014 වර්ෂයේදී සිදු කරන ලදී

**ප්‍රගතිය 2015**

ලේඛක සංවිධානය විසින් පවත්වනු ලැබූ පහත රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් අමාත්‍යාංශය විසින් සලස්වන ලදී.

- ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ලේඛකයෝ විශේෂ හමුව (2015.03.10 -x සහභාගීත්වය -x275*
- දිස්ත්‍රික් නියෝජිත හමුව (2015.03.13 -x සහභාගීත්වය -x 16 *
- දිස්ත්‍රික් නියෝජිත හමුව (2015.07.17 -x සහභාගීත්වය -x 17 *

**ලේඛක සංවිධානය සංස්ථාගත කිරීම**

ශ්‍රී ලංකා ජාතික ලේඛක සංවිධානය සංස්ථාගත කිරීමට අදාළ නීති කෙටුම්පත අනුමැතිය සඳහා 2015.06.11 දින නීති පති දෙපාර්තමේන්තුවට යවා ඇත.

## 6.10 අමාත්‍යාංශ වෙබ් අඩවියට වෙබ් බිහිදොර එක් කිරීම

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 160ක තොරතුරු ඇතුළත් කල හැකි පරිදි වෙබ් බිහිදොර නිර්මාණය කර, අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම්වලින් සමන්විත ත්‍රෛභාෂික වෙබ් අඩවිය සමග සම්බන්ධ කිරීමේ කටයුතු 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. අදාළ දත්ත එක් රැස් කිරීම හා පරිගණකගත කිරීම් අවසන් කර 2015 මාර්තු 18 වන දින වෙබ් විහිදොර අන්තර්ජාලයට මුදා හරින ලදී. centers.cultural.gov.lk යන වෙබ් බිහිදොර ලිපිනයෙන් හෝ www.cultural.gov.lk යන අන්තර්ජාල ලිපිනයෙන් මේ සඳහා පිවිසීමේ හැකියාව ඇති අතර, එයින් ඕනෑම අයෙකුට සංස්කෘතික මධ්‍යස්ථාන 160ට අදාළ තොරතුරු දැක බලා ගැනීමේ හැකියාව ලබා දී ඇත.

# 7.සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය

සාරධර්ම පිරිපුන් සමාජයක් බිහිකිරීමේ උදාර අරමුණ පෙරදැරි කරගෙන සහ දිවයිනේ සිටින ළමුන්ගේ කලා කුසලතාවයන් ඔප්නංවා ජාතික හා ජාත්‍යාන්තර තලයට ගෙන ඒමේ අරමුණින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැඩසටහනක් සංස්කෘතික හා කලාකටයුතු අමාත්‍යාංශය විසින් දියත් කර ඇත. මෙම කටයුතු සඳහා අමාත්‍යාංශය තුළම වෙනම අංශයක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඇතිවිය. ඒ අනුව 2011 වසරේ මුල් වරට සංස්කෘතික ඉදිකිරීම් සඳහා වෙනම අංශයක් ස්ථාපනය කරන ලද අතර එමගින් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම සහ නඩත්තු කටයුතු කරනු ලබයි.

## 7.1 සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

2015 වසරේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා ලබා දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය - රු.මි. 154.71

**I. 2015 වසර අවසන් වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාප්තිය**

- මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ - 331
- විවෘත කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන - 178
- ඉදිවෙමින් පවතින සං.ම. –47

**II. නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම - 2015**

| පළාත | දිස්ත්‍රික්කය | සංස්කෘතික මධ්‍යස්ථානය | 2015 දී ලබාදුන් මුදල රු. |
|---|---|---|---|
| **2015 විවෘත කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන (05)** | | | |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 1. තිරුක්කෝවිල් | 5,000,000.00 |
| | | 2. එරාවූර් නගරය | 2,000,000.00 |
| | | 3.යක්කලමුල්ල | - |
| | | 4.මොණරාගල | - |
| | | 5.උඩුබද්දාව | 596,334.81 |
| | | 6. වරකාපොළ සං.ම. නව ගොඩනැගිල්ල | - |
| | | 7.අඹන්පොළ නව දෙමහල් ගොඩනැගිල්ල | 45,800.00 |
| **2015දෙසැම්බර් 31 වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර විවෘත කිරීමට නියමිත සංස්කෘතික මධ්‍යස්ථාන (03)** | | | |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 1.කුච්චවේලි | - |
| | | 2.ගෝමරන්කඩවල | - |
| | | 3.මොරවැව | - |
| **2015දෙසැම්බර් 31 වන විට ඉදිකිරීම් සිදුකෙරෙන සංස්කෘතික මධ්‍යස්ථාන(44)** | | | |
| උතුර | යාපනය | 1.වංකානයි | 4,640,044.00 |
| | | 2.තෙලිප්පලයි | 6,000,000.00 |
| | | 3.චාවකච්චේරි | 4,000,000.00 |
| | | 4.පේදුරුතුඩුව | 3,330,000.00 |
| | | 5.කරවෙඩ්ඩි(LLRC) | 4,500,000.00 |
| | වවුනියා | 6.වවුනියා(LLRC) | 5,000,000.00 |

| පළාත | දිස්ත්‍රික්කය | සංස්කෘතික මධ්‍යස්ථානය | 2015 දී ලබාදුන් මුදල රු. |
|---|---|---|---|
| නැගෙනහිර | අම්පාර | 7.ඉරක්කාමම් | 4,000,000.00 |
| | | 8.නාවිදන්වේලි | 2,000,000.00 |
| | | 9.දමන(LLRC) | 5,000,000.00 |
| | | 10.මහඔය | 4,000,000.00 |
| | | 11. උහන | 4,000,000.00 |
| | මඩකලපුව | 12.පෝරතිවුපට්ටු - වෙල්ලාවේලි(LLRC) | 5,000,000.00 |
| | ත්‍රිකුණාමලය | 13.වාකරෙයි | - |
| ඌව | බදුල්ල | 14.ඇල්ල | 2,785,924.00 |
| | මොණරාගල | 15. සෙවනගල | - |
| දකුණ | මාතර | 16.මාතර දිස්.සං.ම. | - |
| | | 17.තිහගොඩ | - |
| | | 18. අකුරැස්ස | - |
| | හම්බන්තොට | 19.අම්බලන්තොට | 8,334,013.00 |
| වයඹ | පුත්තලම | 20.මහකුඹුක්කඩවල | - |
| | | 21.මාදම්පේ | - |
| | | 22.කල්පිටිය | - |
| | | 23.මුන්දලම | - |
| | කුරුණෑගල | 24. පොල්පිතිගම රංග ශාලාව | - |
| | | 25. පොල්ගහවෙල | 5,000,000.00 |
| | | 26. මාවතගම | - |
| උතුරුමැද | අනුරාධපුරය | 27.කැබිතිගොල්ලෑව | 4,000,000.00 |
| | | 28.හොරොව්පතාන | 4,000,000.00 |
| | | 29.කහටගස්දිගිලිය | 4,000,000,00 |
| | | 30.තඹුත්තේගම | - |
| | | 31.පලුගස් වැව | 5,000,000.00 |
| | | 32. පදවිය | - |
| | | 33. ඉපලෝගම | 4,000,000.00 |
| සබරගමුව | රත්නපුර | 34.ඇහැලියගොඩ | - |
| | | 35.ඕපනායක | 4,750,000.00 |
| | | 36.කොලොන්න | - |
| | | 37.ඉඹුල්පේ | - |
| | | 38.ගොඩකවෙල | 380,232.00 |
| | | 39.වැලිගෙපොල | - |
| | | 40.දඹුල්ල | - |
| | | 41.දොළව | - |
| | | 42.කැලණිය | 4,000,000.00 |
| | | 43.දිවුලපිටිය | 4,000,000.00 |
| | | 44.අත්තනගල්ල | - |
| **2015 වර්ෂයේදී සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ලබා දී ඇති මුළු මුදල** | | | **105,362,347.81** |

## III. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම් හා නඩත්තු කටයුතු 2015

පහත සඳහන් සංස්කෘතික මධ්‍යස්ථාන වල 2015 ජන 01 සිට දෙසැ .31කාලය තුළ වැඩි දියුණු කිරීම් සහ අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත.

| දිස්ත්‍රික්කය | සංස්කෘතික මධ්‍යස්ථානය | සිදුකරන ලද අළුත්වැඩියාව /වැඩිදියුණු කිරීම | ලබාදුන් මුදල රු. |
|---|---|---|---|
| මහනුවර | පූජාපිටිය | සං.ම. අලුත්වැඩියාව හා භූමිය මැනීම සඳහා මැනුම් ගාස්තු ගෙවීම | 105,500.00 |
| | හතරලියැද්ද | විදුලි බිල, දුරකතන බිල, පත්තර බිල, තීන්ත ආලේපය හා ඉඩම සුද්ද කිරීම | 108,639.17 |
| | හාරිස්පත්තුව | විදුලි සැපයුම අලුත්වැඩියාව හා භූමිය මැනීම සඳහා මැනුම් ගාස්තු ගෙවීම | 105,140.00 |
| | පාතදුම්බර | ප්‍රධාන ගේට්ටුව සෑදීම | 49,500.00 |
| | කුණ්ඩසාලේ | භූමිය මැනීම සඳහා මැනුම් ගාස්තු ගෙවීම | 55,500.00 |
| | උඩුනුවර | භූමිය මැනීම සඳහා මැනුම් ගාස්තු ගෙවීම | 55,500.00 |
| | දෙල්තොට | වහලය අලුත්වැඩියා කිරීම | 47,550.00 |
| | මිණිපේ | සං.ම. අලුත්වැඩියා කටයුතු | 389,644.00 |
| මාතලේ | රත්තොට | බෝ ගස කපා ඉවත් කිරීමට | 30,000.00 |
| | උකුවෙල | ජනේල් පියන් අලුත්වැඩියාව | 3,405.00 |
| | විල්ගමුව | 2012-2015 හිඟ වරිපනම් ගාස්තු ගෙවීම | 6,408.60 |
| | මාතලේ | 2015 වර්සයට අදාළ වරිපනම් ගාස්තු හා 2006 - 2011 වර්ෂයන්ට අදාළ හිඟ වරිපනම් ගාස්තු | 57,965.65 |
| | දඹුල්ල | ජල බිල ගෙවීම | 8,800.00 |
| | යටවත්ත | සං.ම. නව ගොඩනැගිල්ල ඉදිකිරීම | 6,720,954.00 |
| | රත්තොට | ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 533,411.00 |
| නුවරඑළිය | නුවරඑළිය | 2015 වර්ෂයට අදාළ වරිපනම් ගාස්තු | 10,854.00 |
| අම්පාර | කල්මුනේ -මුස්ලිම් | තාවකාලිත වතුර ටැංකියක් සවි කිරීම | 17,500.00 |
| ත්‍රිකුණාමලය | සේරුනුවර | සං.මධ්‍ය. වහල අලුත්වැඩියාව | 500,000.00 |
| අනුරාධපුර | ගල්නෑව | සංස්කෘතික මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක පද්ධතිය සැකසීම | 1,375,000.00 |
| | කැකිරාව | සංස්කෘතික මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැට ඉදිකිරීම | 392,580.00 |
| | නොච්චියාගම | වතුර මෝටරය අලුත්වැඩියා කිරීම | 2,950.00 |
| | මැදිරිගිරිය | වරිපනම් ගාස්තු හා වහල අලුත්වැඩියාව | 26,821.12 |
| | මරදන්කඩවල | අලුත්වැඩියා කටයුතු | 805,073.00 |
| පොළොන්න රුව | හිඟුරක්ගොඩ | සං.මධ්‍ය. වහල අලුත්වැඩියාව හා වරිපනම් ගාස්තු | 6,794,105.36 |

| දිස්ත්‍රික්කය | සංස්කෘතික මධ්‍යස්ථානය | සිදුකරන ලද අළුත්වැඩියාව /වැඩිදියුණු කිරීම | ලබාදුන් මුදල රු. |
|---|---|---|---|
| | ඇළහැර | සං.මධ්‍යස්ථානයේ ජනෙල් පියන් අලුත්වැඩියාව | 129,789.00 |
| | ලංකාපුර | ජල නල පද්ධතිය ලබාදීමට | 26,679.00 |
| වවුනියා | වවුනියා -දකුණ | තීන්ත ආලේපය | 46,670.00 |
| කුරුණෑගල | වාරියපොළ | සං.ම. සනීපාරක්ෂක පද්ධතිය ඉදිකිරීම හා එළිමහන් වේදිකාවේ වහලය හා නේපත්‍යාගාරය සැකසීම | 4,163,680.00 |
| | නැගෙනහිර කුලියාපිටිය | සං.ම. ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 1,110,638.00 |
| | අඹන්පොල | සං. මධ්‍යා. දෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සව වියදම් | 45,800.00 |
| | නැ. පඬුවස්නුවර | අලුත්වැඩියා කටයුතු | 248,324.00 |
| | ගල්ගමුව | අලුත්වැඩියා කටයුතු | 586,289.00 |
| රත්නපුර | නිවිතිගල | අලුත්වැඩියා කටයුතු | 1,234,320.00 |
| පුත්තලම | පල්ලම | සං.මධ්‍යස්ථානයේ නළ ළිඳේ වැඩ අවසන් කිරීම, ජල සැපයුම ලබාදීම | 243,909.00 |
| | දංකොටුව | සං.ම. ජලනළ පද්ධතිය සැකසීම හා අලුත්වැඩියාව | 213,735.00 |
| | ආරච්චිකට්ටුව | සං.ම. ආරක්ෂිත වැට ඉදිකිරීම හා ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 434,308.00 |
| කෑගල්ල | කෑගල්ල | නව සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම හා හිඟ ජල බිල්පත් පියවීම | 6,698,296.49 |
| | යටියන්තොට | සංස්කෘතික මධ්‍යා. වෙනත් ගොඩනැගිල්ලකට ගෙන යාම හා එහි අලුත්වැඩියා | 594,000.00 |
| | දෙහිඕවිට | වරිපනම් ගාස්තු, විදුලි ටිප් ස්විචය සවි කිරීම හා පැරණි දොර ජනේල් අලුත්වැඩියාව | 27,375.00 |
| ගාල්ල | ගාල්ල | බලපිටිය සංස්.මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,535,624.00 |
| | වැලවිට දිවිතුර | සංස්. මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීම | 58,055.00 |
| | ගෝනපිනුවල | සංස්. මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැට හා ගේට්ටුව ඉදිකිරීම | 1,255,009.00 |
| | බද්දේගම | වහල අලුත්වැඩියාව | 680,490.00 |
| හම්බන්තොට | වීරවිල | සං.මධ්‍යා. ප්‍රධාන ගේට්ටුව පිළිසකර කිරීම | 56,271.00 |
| | කටුවන | සංස්. මධ්‍යස්ථානයේ කොටසක් අළුත්වැඩියා කිරීම | 49,820.00 |
| මාතර | හක්මන | සංස්කෘතික මධ්‍යස්ථානයට සනීපාරක්ෂක පහසුකම් ලබාදීම | 197,465.00 |
| | කොටපොළ | සං.මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැට ඉදිකිරීම | 660,831.00 |

| දිස්ත්‍රික්කය | සංස්කෘතික මධ්‍යස්ථානය | සිදුකරන ලද අළුත්වැඩියාව /වැඩිදියුණු කිරීම | ලබාදුන් මුදල රු. |
|---|---|---|---|
| | නුපේ | සංස්. මධ්‍යස්ථානයේ වහලය අලුත් වැඩියාව | 1,865,479.00 |
| | මාලිම්බඩ | සංස්. මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැට ඉදි කිරීම | 1,630,553.00 |
| | පස්ගොඩ | වැහිපීලි අලුත් වැඩියාව | 22,805.00 |
| | වැලිපිටිය දෙනිපිටිය | සනීපාරක්ෂක පද්ධතිය අලුත් වැඩියා කිරීම | 35,490.00 |
| බදුල්ල | ඌව පරණගම | සංස්. මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය පිළිසකර කිරීම | 360,791.00 |
| | හල්දුම්මුල්ල | සංස්. මධ්‍යස්ථානයේ වහලය අලුත් වැඩියාව, වරිපනම් බදු | 1,632,804.14 |
| | හාලිඇල | මැනුම් ගාස්තු | 55,500.00 |
| ගම්පහ | ඇඹරළුව | සංස්. මධ්‍යස්ථාන තෙමහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම හා පරිශ්‍රය වටා කම්බි වැට ඉදිකිරීම | 988,471.00 |
| | මීරිගම | සංස්. මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම, අඩුපාඩු සකස් කිරීම හා ගස් 11ක අතු කැපීම | 1,098,588. |
| | වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය | ජල මෝටරය අලුත්වැඩියාව | 7,650.00 |
| | දොම්පේ | එළිමහන් රංගපීඨය ගලවා ඉවත් කිරීම | 36,000.00 |
| කළුතර | මිල්ලනිය | සංස්. මධ්‍යස්ථාන භූමියේ මැනුම් කටයුතු | 28,000.00 |
| | පානදුර | සනීපාරක්ෂක පද්ධතියේ දොරක් සවි කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූරණය | 6,508.00 |
| | බේරුවල | නව ජල සැපයුමක් ලබාගැනීම | 44,581.50 |
| | කළුතර | කාර්යාල ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම | 36,145.00 |
| කොළඹ | පාදුක්ක | සං.ම. අලුත්වැඩියා කටයුතු | 3,000,000.00 |
| **සංස්කෘතික මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු සඳහා ලබාදුන් මුදල** | | | **49,349,544.03** |

## IV. 2015.12.31ට සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නඩත්තු කටයුතු වල සමස්ත මූල්‍යය ප්‍රගතිය

නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ලබාදුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය - රු. **105,362,347.81**

සංස්කෘතික මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම් හා නඩත්තු සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය - රු. **49,349,544.03**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන 2015 රු.මි. | වියදම 2015.12.31 දිනට | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| **163-2-3-16-2502** - සං.ම.පහසුකම් වැඩිදියුණු කිරීම | **4.00** | **4.00** | **100%** |
| **163-2-3-23-2502** සං.ම. ඉදිකිරීම | **180.00** | **139.47** | **77%** |
| **163-2-3-30-2502** සං.ම. සඳහා සංගීත උපකරණ ලබා දීම | **35.00** | **31.37** | **90%** |
| **සමස්ථ මූල්‍යය ප්‍රගතිය** | **219.00** | **174.84** | **80%** |

## 7.2 සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### I. ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

වේගයෙන් අභාවයට යමින් පවතින ආදිවාසී ජනයාගේ සොබාදහම සමග බැඳි ජීවන රටාව,වෙද හෙදකම් ආදී පැරණි දැනුම, සිරිත් විරිත්, ශාන්ති කර්ම, ජන ගායනා, භාෂා සාහිත්‍ය, කලාත්මක හැකියාවන් ආදී වූ සංස්කෘතිකාංග සංරක්ෂණය කිරීම මෙහි අරමුණයි.

**ක්‍රියාකාරකම්**

1. වැදි ජනතාවගේ සංස්කෘතික අවශ්‍යතාවය,දෘෂ්‍යාත්මක සංස්කෘතිය, චර්යාත්මක ප්‍රකාශනය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය.
2. වැදි ජනයා පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක පර්යේෂණය.
3. ආදිවාසීන්ගේ පාරම්පරික වෙදකම හා ආහාර රටාව පිළිබඳ අධ්‍යයනය කිරීම හා ප්‍රවර්ධනයට කටයුතු කිරීම.
4. **ආදිවාසීන් සඳහා නිවාස තැනීම.**
   - අම්පාර - පොල්ලෙබැද්ද - නිවාස 30
   - අම්පාර - හෙනානිගල - නිවාස 20
   - මොණරාගල - රතුගල -නිවාස 20
   - වාකරේ - කුංචකුලම් - නිවාස 30
   - මහියංගනය - දඹාන -නිවාස 25
5. **නව ජන උරුම කේන්ද්‍ර ස්ථාපනය**
   වාකරේ හා හෙනානිගල

**ව්‍යාපෘතියේ අවසන් කරන ලද ක්‍රියාකාරකම්**

- 1,2 හා 3 යන අරමුණු ඉටු කර ගැනීමට අදාළ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු 2011 වර්ෂයේදී අවසන් කරන ලද අතර ඊට අදාළව පහත සඳහන් පර්යේෂණ ග්‍රන්ථයන් 2012 වර්ෂයේදී සම්පාදනය කරන ලදී.
  1. වැද්දා - වැදි ජන පර්යේෂණ, සාහිත්‍ය විමර්ශන සහ තොරතුරු නාමාවලිය
     (ප්‍රේමකුමාර ද සිල්වා, චින්තක රණසිංහ)
  2. ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ පාරම්පරික උරුමය
     (දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව)
  3. Rock Paintings and Engraving Sites in Sri Lanka
     (Raj Somadeva)(PGIAR)
- 4 වන අරමුණ යටතේ ආදිවාසීන් වෙනුවෙන් 2013.12.31 වන විට නිවාස 125ක් සාදා අවසන් කර ඇත.

**ප්‍රගතිය - 2015 - ආදි වාසී ජන උරුම කේන්ද්‍ර ස්ථාපනය**

| පළාත | දිස්ත්‍රික්කය | ජන උරුම කේන්ද්‍රය | ඇස්තමේන්තුගත මුදල රු.මි. | භෞතික ප්‍රගතිය 2015.12.31 ට | 2015 වසරේදී ලබා දී ඇති මුදල රු.මි. | ලබා දී ඇති මුළු මුදල රු.මි. |
|---|---|---|---|---|---|---|
| නැගෙනහිර | මඩකලපුව | වාකරේ | 2.00 | ඉදිකිරීම් 40%ක් අවසන් | 0.80 | 1.20 |
| | අම්පාර | හෙනානිගල | 9.86 | ඉදිකිරීම් 20%ක් අවසන් | 1.95 | 1.95 |

**සමස්ථ ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය**

ප්‍රතිපාදන 2015 - **රු.මි. 7.5** 2015 දෙසැම්බර් 31 ට වියදම - **රු.මි. 5.16** වියදම් ප්‍රතිශතය - **69 %**

**2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මි. 24.16**

***මීට අමතරව දඹාන ජන උරුම කේන්ද්‍රයේ නඩත්තු කටයුතු සඳහාද වාර්ෂිකව අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලබන අතර 2015 වර්ෂයේදී ලබා දුන් මුදල රු.මි. 1.97 කි.**

## II. සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනය ඉදිකිරීම - හික්කඩුව

විදේශීය සංචාරකයින් බහුලව ගැවසෙන හික්කඩුව ප්‍රදේශයට ඔවුන්ට අවශ්‍ය වන පහසුකම් (ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම තොරතුරු පිළිබඳ වාර්තා චිත්‍රපට , දේශීය සංස්කෘතික හා කලා අංග පිළිබඳ දෘෂ්‍ය පට ප්‍රදර්ශනය,විවිධ භාෂා වලින් රචිත පොත්පත් සහිත පුස්තකාල පහසුකම්,අන්තර්ජාල පහසුකම් ආදී නව තාක්ෂණික සේවාවන්) සහිත මධ්‍යස්ථානයක් පිහිටුවීම ප්‍රධාන අරමුණ කර ගෙන 2011 අගෝස්තු මාසයේදී මෙම සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

**මුළු ඇස්තමේන්තුගත වියදම රු.මි. 353 (දේශීය අරමුදල්)**

**ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කොටස් 03 ක් වශයෙන් සිදු කිරීමට නියමිතය.** ඒවා නම්

පළමු අදියර - සංස්කෘතික මධ්‍යස්ථානය, පුස්තකාලය, පරිපාලන කාර්යාලය

දෙවන අදියර - ශ්‍රවණාගාරය, ආපන ශාලාව (විදේශීය සංචාරකයන්ට ද ගැලපෙන පරිදි පහසුකම් වලින් සමන්විත එකවර 100 කට පමණ සංග්‍රහ කල හැකි දේශීය ආහාර වලින් යුත් ආපන ශාලාව), අලෙවි කුටි

තුන්වන අදියර - නේවාසික පහසුකම්

- **සංස්කෘතික මධ්‍යස්ථානය, පුස්තකාලය, පරිපාලන කාර්යාලය යන පළමු අදියරේ ඉදිකිරීම් සම්පූර්ණයෙන් නිමා කර ඇත.**

**භෞතික ප්‍රගතිය - 2015**

මධ්‍යස්ථානය වටේ තාප්පය ඉදිකිරීම හා භූමි අලංකරණ කටයුතු අවසන් කරන ලදී.

**මූල්‍යය ප්‍රගතිය - 2015**

ප්‍රතිපාදන 2015 - රු.මි. 47 2015 දෙසැම්බර් 31 ට වියදම - රු.මි. 13.72 වියදම් ප්‍රතිශතය - 29 %

**2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මි. 96.64**

## III. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය - මාතර, නාවිමන, මොරකැටියහේන

කලාපීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම හා නගා සිටුවීමත්, විවිධ සම්ප්‍රදායන් හා උසස් සංස්කෘතික විවිධත්වයන් අතර සම්බන්ධතාවයන් ගොඩනැගීමත් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීමේ මූලික අරමුණ වේ. මෙම මධ්‍යස්ථානය කලාපීය කලාකරුවන්ගේ ප්‍රධානතම රැස්වීම් මූලස්ථානය ලෙසත්, කලාපීය සම්ප්‍රදායික කලාකරුවන් දිරිමත් කිරීමට හා ඔවුන්ට අනුග්‍රහය දැක්වීමට වැඩසටහන් හඳුන්වාදෙන සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක වනු ඇත. 2011 ජුලි 21 සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

**මුළු ඇස්තමේන්තුගත වියදම රු.මි. 1583.6 (දේශීය අරමුදල්)**

**ව්‍යාපෘතියේ ප්‍රධාන අංග**

- ප්‍රධාන ගොඩනැගිල්ල ( වර්ග අඩි 100,543.38 )
- පුහුණු මධ්‍යස්ථානය (වර්ග අඩි 37,213.75 )
- සාර්ක් රටවල් සහ අනිකුත් අමුත්තන් සඳහා වන නේවාසික පහසුකම් (වර්ග අඩි 41,524.90)
- ඉදිරි රථ ගාල හා පිවිසුම (වර්ග අඩි 63,204 )

**උපදේශකත්වය -** වාස්තු විද්‍යා පීඨය, මොරටුව විශ්ව විද්‍යාලය

**ඉදිකිරීම් වගකීම -** සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා යුධ හමුදාවේ 4 වන ඉංජිනේරු බලකාය

**භෞතික ප්‍රගතිය - 2015 -** ඉදිකිරීම්(සිවිල් කාර්යයන්ගේ) ප්‍රගතිය පහත පරිදි වේ.

**ප්‍රධාන ගොඩනැගිල්ල 95%**
**පුහුණු මධ්‍යස්ථානය 90%**
**සාර්ක් රටවල් සඳහා නේවාසික පහසුකම්, කළමනාකරුගේ නිවාසය හා නේවාසිකාගාර 20%**
**(ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මෙම ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවන ලදී.)**

**මූල්‍යය ප්‍රගතිය - 2015**

ප්‍රතිපාදන 2015 - රු.මි. 150 2015 දෙසැම්බර් 31 ට වියදම - රු.මි. 150 වියදම් ප්‍රතිශතය - 100 %

**2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මි. 798.57**

## IV. වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම

වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය අසල ඇති වසාදැමූ කර්මාන්ත ශාලාව පවරාගෙන රංග ශාලාවක් හා නේවාසිකාගාරයක් බවට වැඩිදියුණු කිරීම කරනු ලැබේ.

**ප්‍රගතිය - 2015**

නව නේවාසිකාගාර ගොඩනැගිල්ල වටා අඩි 400ක් දිග තාප්පය ඉදිකිරීම හා කොඩි කණු ඉදිකිරීම, මුරකුටිය සෑදීම හා ගේට්ටුව අළුත්වැඩියාව අවසන් කර ඇත.

**මූල්‍යය ප්‍රගතිය - 2015**

ප්‍රතිපාදන 2015 - රු.මි. 2.0 2015 දෙසැම්බර් 31 ට වියදම - රු.මි. 1.88 වියදම් ප්‍රතිශතය - 94 %

## V. සංගීත හා නර්තන භාණ්ඩ නිෂ්පාදනය කරන පැරණි ශිල්ප ගම්මාන සංවර්ධනය කිරීම

2012 අයවැය යෝජනාවකි.

**ප්‍රතිලාභී ශිල්ප ගම්මාන**

| දිස්ත්‍රික්කය/ප්‍රාදේ කොට්ඨාශය | ප්‍රතිලාභී ගම්මානය | කර්මාන්තයේ නියැලෙන පවුල් සංඛ්‍යාව | නිරතවන කර්මාන්තය |
|---|---|---|---|
| මාතලේ - උකුවෙල | දෙහිදෙනිය | 25 | පිත්තල තාලම්පට, පන්තේරු, සිලම්බු, අත් වළලු. හොරණෑ, සේසත්(උපාංග) ආදිය |
| මාතලේ - උකුවෙල | ලැලිඅඹේ | 20 | සේසත් මිට, අළු බඳුන්, විසිතුරු භාණ්ඩ, උඩැක්කි, බෙර, හොරණෑ |
| මාතලේ - යටවත්ත | උණවේරුව | 40 | සේසත් සකස් කිරීම හා අලංකරණය |
| මහනුවර - යටිනුවර | ගෝවින්දල | 55 | පිත්තල ආශ්‍රිත නිර්මාණ |
| මහනුවර -උඩුනුවර | කුරගල වැලිගල්ල | 19 | උඩරට පහතරට සියලුම නර්තන භාණ්ඩ, සංගීත භාණ්ඩ සකස් කිරීම සහ අළුත්වැඩියාව |
| මාතර - වැලිගම | ලැබීම | 02 | උඩරට පහතරට බෙර, ඩොලැක්කි |
| ගාල්ල - අම්බලන්ගොඩ | අම්බලන්ගොඩ<br>ඌරගහ<br>මහ අම්බලන්ගොඩ<br>වතුගෙදර | 15 | බෙර සහ සංගීත භාණ්ඩ |

**ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්**

1. ශිල්ප ගම්මානවල යටිතල පහසුකම් දියුණු කිරීම
   - දෙහිදෙනිය - නිමවුම් අලෙවිය පහසු කිරීම පිණිස අලෙවි ප්‍රදර්ශන කුටියක් මාතලේ අළුවිහාරය අසල ඉදිකිරීම(ඇස්තමේන්තුගත මුදල රු.මි. 2.7)
   - දෙහිදෙනිය -ලැලිඅඹේ ගම්මාන සඳහා වැඩ කුටි 48 ක් සකස් කිරීමට අමුද්‍රව්‍ය ලබා දීම. (ඇස්තමේන්තුගත මුදල රු.මි.6.3)
   - කුරගල වැලිගල්ල - කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා සහ අලෙවි කටයුතු සඳහා පොදු ගොඩනැගිල්ලක් ඉදිකිරීම
2. ශිල්ප ගම්මානවල ශිල්පීන් අවශ්‍යා පුහුණුව සඳහා යොමු කිරීම.

### 2014 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය

- උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලැලිඅඹේ සහ දෙහිදෙනිය ග්‍රාමය සඳහා නිෂ්පාදන කුටි 10 ක් සෑදීම සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති අතර එම කුටි සාදා නිමකර ඇත.

- 2014.03.11 හා 12 යන දිනයන්හි මාතලේ යටවත්ත ගම්මානයේ ශිල්පීන් 46 ක් සඳහා පහත ක්ෂේත්‍ර පාදක කර ගෙන පුහුණුවක් ලබා දෙන ලදී. මීට සමාන්තරව ශිල්පීන්ට අවශ්‍ය උපකරණ කට්ටල 46 ක් බෙදා දීම ද සිදු කරන ලදී.
    - සංචාරක වෙළඳ පොළ ඉලක්ක කර ගනිමින් මෙම ශිල්පීන් සිදු කරනු ලබන සේසත් වැනි අලංකාර නිර්මාණ කුඩා ප්‍රමාණයේ සමරු තිළිණ ආකාරයෙන් නිෂ්පාදනය කිරීම
    - නිෂ්පාදන උසස් තත්වයෙන් නිෂ්පාදනය කර ජාත්‍යන්තර වෙළඳ පොළට ඉදිරිපත් කල හැකි අයුරින් ඇසුරුම් සකස් කර ගන්නා ආකාරය

**භෞතික ප්‍රගතිය 2015**

දෙහිදෙනිය හා ලැලිඅඹේ ගම්මාන සඳහා සාදා නිම කර ඇති නිෂ්පාදන 10 හි ප්‍රගතිය උකුවෙල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් වාර්තා නොකිරීම නිසා ඉතිර නිෂ්පාදන කුටි 38 සඳහා ප්‍රතිපාදන ලබා දීමට නොහැකි වී ඇත.

## VI. මහනුවර හා අනුරාධපුරයේ ප්‍රසංග කලා රඟහල් ඉදිකිරීම

2014 අයවැය යෝජනාවකට අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ ව්‍යාපෘති දෙකකි.

**ප්‍රගතිය - 2015**

- **අනුරාධපුර**

  බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් අක්කර 04ක ඉඩමක් දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ගෙන ඇත. ආදර්ශ සැලසුම් සකස් කරන ලදී.

- **මහනුවර**

  පේරාදෙණිය වි.වි. අයත් අක්කර 08ක ඉඩමක් ගන්නෝරුව පාරේ ගැටඹේ ප්‍රදේශයෙන් පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

එක් රඟහලකට මුළු ඇස්තමේන්තුගත මුදල රු.මි.2,000 බැගින් වන අතර 2015-2017 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ රජයේ ඒකාබද්ධ අරමුදලින් මෙම ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත.

## VII. අංගම්පොර ගම්මානය - මහව (මහව ශිල්ප කලා ගම්මානය)

දේශීය ශිල්ප කලාවන් සහ එයට පාදක වන පාරම්පරික දැනුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රදේශයේ ශිල්ප කලා ගම්මානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී මූලික කටයුතු ආරම්භ කරන ලදී.

**අරමුණ** - සමාජයෙන් ගිලිහී යමින් පවතින අංගම් වැනි දේශීය සටන් කලාවන් හා අනෙකුත් ශිල්ප කලාවන් සහ ඊට පාදක වූ පාරම්පරික දැනුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය මගින් එම ශිල්ප කලාවන් පවත්වාගෙන යාමත් වර්තමාන සංවර්ධන කාර්යයන් සඳහා දායක කර ගැනීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණවේ.

**මුළු ඇස්තමේන්තුගත මුදල -** රු.මි. 57.12

**භෞතික ප්‍රගතිය - 2015**

අංගම්පොර කලා ශිල්පීන්ගේ අදහස් හා රාජ්‍ය සංස්කෘතික ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන සාකච්ඡා වාර කිහිපයකින් පසුව ව්‍යාපෘතිය වයඹ ඉංජිනේරු කාර්යාලය හරහා සිදු කර ගැනීම පිණිස ප්‍රතිපාදන වයඹ ඉංජිනේරු කාර්යාලය වෙත මුදා හැරීම සිදු කරන ලදී.

**මූල්‍යය ප්‍රගතිය - 2015**

ප්‍රතිපාදන 2015 - රු.මි. 30.0 2015 දෙසැම්බර් 31 ට වියදම - රු.මි. 30.0 වියදම් ප්‍රතිශතය - 100 %

# 8. විදේශ සංස්කෘතික සබඳතා

**කාර්යභාරය**

ශ්‍රී ලාංකේය සංස්කෘතිය ලෝක ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම අරමුණු කර ගෙන පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.

- සංස්කෘතික කණ්ඩායම් විදේශයන් සමඟ හුවමාරු කර ගැනීම.
- අධ්‍යයන චාරිකා සඳහා සංස්කෘතික කණ්ඩායම් හුවමාරු කර ගැනීම.
- ස්පර්ශ හා අස්පර්ශ සංස්කෘතික ක්ෂේත්‍රයේ විශේෂඥයින් විදේශයන්ගෙන් ගෙන්වා ගැනීම.
- සංස්කෘතික ප්‍රදර්ශන විදේශ රටවල් වල දී පැවැත්වීම.
- ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රදර්ශනවලට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- විදේශ පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට නිලධාරීන් සහ අදාළ අවස්ථාවලදී ශ්‍රී ලාංකික දූත පිරිස් සහභාගී කරවීම.
- සංස්කෘතික අගයන් සුරැකීම සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ආයතන (UNESCO, SAARC,ICOMOS, ICCROM, BIMSTEC) වලින් ආධාර ලබා ගැනීමට කටයුතු කිරීම.
- රටවල් සමග ද්විපාර්ශවික ගිවිසුම් ඇති කර ගැනීම, ගිවිසුම් යාවත්කාලීන කිරීම හා ගිවිසුම් අනුව වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- අන්තර් ජාතික සංස්කෘතික තරඟවලට ශ්‍රී ලාංකිකයන් සහභාගී කරවීම ඇතුළු සම්බන්ධීකරණ කටයුතු.
- විදේශයන්හි ඇති ශ්‍රී ලංකාවේ වටිනා පුරා වස්තූන් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

## දෙස් විදෙස් සංස්කෘතික හුවමාරු වැඩසටහන - 2015

### I. එළඹ ඇති ද්විපාර්ශ්වික ගිවිසුම්

| | |
|---|---|
| **2015** දෙසැම්බර් **31**වන විට එළඹ ඇති අවබෝධතා ගිවිසුම් ගණන | **- 58** |
| **2015** දෙසැම්බර් **31** වන විට බලපැවැත්වෙන අවබෝධතා ගිවිසුම් ගණන | **- 30** |
| ඉදිරියේදී එළඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් ගණන | **- 10** |

## II. 2015 වර්ෂයේදී එළඹී අවබෝධතා ගිවිසුම්

| අවබෝධතා ගිවිසුම | දිනය | සහභාගීත්වය |
|---|---|---|
| Programme Of Cultural Co-Operation between Sri Lanka & India for year **2015 - 2018** | **2015** පෙබරවාරි **16** වන දින | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හා ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර |

## III. පවත්වන ලද සංස්කෘතික සහයෝගිතා වැඩසටහන්

**විදේශ සංස්කෘතික සංචාර**

| | වැඩසටහන හා රට | දිනය / කාල වකවානුව | සහභාගීත්වය |
|---|---|---|---|
| 01. | සූරාජ්කුණ්ඩ් ජාත්‍යන්තර අත්කම් මේලාව<br>**හරියානා - ඉන්දියාව** | **2015** ජනවාරි **31** සිට පෙබරවාරි **14** දක්වා | නිලධාරීන් - 02<br>රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන් - 04<br>සංස්කෘතික මධ්‍යස්ථාන ශිල්පීන් - 09 |
| ***02.*** | ***UNWTO/UNESCO*** විසින් සංවිධානය කරන ලද සංචාරක කර්මාන්ත සහ සංස්කෘතික සමුළුව<br>**කාම්බෝජය** | **2015** පෙබරවාරි **04** සිට **06** දක්වා | ගරු අමාත්‍යතුමා හා පෞද්ගලික ලේකම්තුමා |
| 03. | සාර්ක් සංස්කෘතික ජන නැටුම් සැණකෙළිය<br>**භූතානය** | **2015** අප්‍රේල් **08** සිට **11** දක්වා | නිලධාරීන් - 01<br>සංස්කෘතික මධ්‍යස්ථාන ශිල්පීන් - 06 |
| ***04.*** | ***37*** වැනි තුර්කි ජාත්‍යන්තර ගුවන්විදුලි හා රූපවාහිනී ළමා සැණකෙළිය<br>**අන්ටාලියා - තුර්කිය** | **2015** අප්‍රේල් **13** සිට **26** දක්වා | නිලධාරීන් - 02<br>ශිල්පීන් - 13 |
| 05. | ජාත්‍යන්තර බෙරවාදන හා කලා සැණකෙළිය<br>**ඊජිප්තුව** | **2015** අප්‍රේල් **18** සිට **26** දක්වා | නිලධාරීන් - 02<br>රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන් - 11 |
| 06. | බැන්ඩුන් සමුළුවේ **60** වන සංවත්සරය<br>**බැන්ඩුන් - ඉන්දුනීසියාව** | **2015** අප්‍රේල් **20** සිට **28** දක්වා | නිලධාරීන් - 02<br>සංස්කෘතික මධ්‍යස්ථාන ශිල්පීන් - 09 |

| | වැඩසටහන හා රට | දිනය / කාල වකවානුව | සහභාගිත්වය |
|---|---|---|---|
| 07. | කල්කටා ජාත්‍යන්තර (පයනියල්) නාට්‍ය උළෙල නියෝජනය කිරීම<br><br>**ඉන්දියාව** | **2015 ජූනි 07 දින** | පරාක්‍රම නිරිඇල්ල මහතා සහ නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයන් 09 දෙනකු සහභාගි වූහ. |
| 08. | Seminar for Directors of Festivals from Developing Countries<br><br>**චීනය** | **2015 ජූනි 26 සිට ජූලි 15 දක්වා** | නිලධාරින් - 04 |
| 09. | ලාභ නොලබන ආයතන සඳහා කෞතුකාගාර කළමණාකරන වැඩමුළුව<br><br>**චීනය** | **2015 ජූනි 07 සිට ජූනි 17 දක්වා** | නිලධාරින් - 03 |
| 10. | Cultural Partnership Initiative Programme 2015,Andong,**Korea** | **2015 ජූලි 01 සිට ඔක්තොම්බර් 31 දක්වා** | ශිල්පින් 01 |
| 11. | SAARC Artists Camp and Exhibition of Paintings Themes : Historical Sites. Bamyan,<br><br>**Afganistan** | **2015 අගෝස්තු 22 සිට 27 දක්වා** | කලා මණ්ඩලය නියෝජනය කළ ශිල්පින් 04 |
| 12. | The 6th Beijing International Art Binnale, 2015<br><br>**China** | **2015 සැප්තැම්බර් 23 සිට 27 දක්වා** | කලා මණ්ඩලය නියෝජනය කළ ශිල්පියෙක් |
| 13. | SAARC Sufi Festival-Jaipur, **India** in the Pink City | **2015 ඔක්තොම්බර් 10,11,12** | නිලධාරීන් 04 |
| 14. | 2015 Seminar on Public Administration for Civil Servants in Asian Countries<br><br>**China** | **2015 ඔක්තොම්බර් 19 සිට නොවැම්බර් 08 දක්වා** | නිලධාරීන් 05 |
| 15. | Third International Miniature Art Exhibition<br><br>**Dhaka** | **2015 නොවැම්බර් 30** | නිලධාරීන් 01 |
| 16. | 3rd Asia Cultural Forum<br><br>**China** | **2015 නොවැම්බර් 08 සිට 11 දක්වා** | නිලධාරීන් 02 |

## IV. ශ්‍රී ලංකාවට විදේශීය කණ්ඩායම් පැමිණීම්

| | වැඩසටහන හා අමාත්‍යාංශයේ කාර්ය භාරය | පැමිණි රට හා සංඛ්‍යාව | දිනය / කාල වකවානුව |
|---|---|---|---|
| **01** | **ඉන්දියානු ජනරජ දිනය**<br>1. ශ්‍රවණාගාරය සඳහා අදාල ගාස්තු ගෙවීම.<br>2. ආරාධනා පත්‍ර, ලිපි කවර, බැනර්, ඡායාරූප මුද්‍රණය, දැන්වීම් පත්‍රිකා සඳහා වැයවූ මුදල ලබා දීම.<br>3. ආරාධනා පත්‍ර බෙදා හැරීමේ ගාස්තු ලබා දීම.<br>4. ශ්‍රවණාගාරය සැරසීමට අදාල වියදම් ලබා දීම.<br>5. ගාස්තු රහිත වීසා පහසුකම් ලබාදීම සඳහා සහයෝගය දැක්වීම.<br>6. සැමරුම් භාණ්ඩ මිලදී ගැනීම සඳහා සහයෝගය දැක්වීම. | ඉන්දියාව - **5** | **2015** ජනවාරි **25** |
| **02** | **චීන ලූනාර් අවුරුදු උත්සවය (Spring Festival)**<br>1. 2015 පෙබ. 07 නෙළුම් පොකුණ රඟහල හා 2015 පෙබ. 07 පල්ලෙකැලේ ප්‍රසංග සංවිධානය කිරීම.<br>2. චීන දූත පිරිසට නවාතැන් පහසුකම්,ප්‍රවාහන පහසුකම් උත්සව කටයුතු සංවිධානය කිරීම සඳහා අදාල වියදම් ලබා දීම. | චීනය - **32** | **2015** පෙබරවාරි **05** සිට **09** දක්වා |
| **03** | **ඉන්දියානු නිදහස් දිනය සැමරීම**<br>**1.** ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය සංවිධානය කල උත්සව කටයුතු සඳහා මූල්‍යය දායකත්වය සැපයීම හා සහාය ලබා දීම සිදු කරන ලදී. | ඉන්දියාව - 6 | **2015 අගෝස්තු මස 10 සිට 15 දක්වා** |

# 9. සැපයුම් හා ප්‍රසම්පාදන කටයුතු

අමාත්‍යාංශය විසින් දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථානවලට අවශ්‍ය සැපයීම් කටයුතු, නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු හා සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම වැනි ප්‍රධාන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ද සිදුකරනු ලබන බැවින් සැපයුම් හා ප්‍රසම්පාදන කාර්යයන් වඩාත් කාර්යක්ෂම අයුරින් සිදු කිරීමට **සැපයුම් හා ප්‍රසම්පාදන අංශයක්** 2011 දී ස්ථාපනය කරන ලදී.

## ප්‍රසම්පාදන අංශය මගින් ඉටුකරනු ලබන කාර්ය භාරය

I. ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම්
II. අමාත්‍යාංශයට හා ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථානවලට අවශ්‍ය උපකරණ හා වෙනත් ගබඩා ද්‍රව්‍ය මිලට ගැනීම.
III. නව වාහන මිලදී ගැනීම, පවත්නා වාහන අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම.
IV. වාහන වලට අවශ්‍ය ටයර්, ටියුබ් හා බැටරි මිලට ගැනීම.
V. උත්සව සඳහා අවශ්‍ය වන ආහාරපාන, නවාතැන් ඇතුළු සියලුම සැපයුම් සේවා ලබා ගැනීම.
VI. සංස්කෘතික මධ්‍යස්ථාන වලට අවශ්‍ය නර්තන ඇඳුම් මිලට ගැනීම හා සකස් කර ගැනීම.
VII. ප්‍රකාශන මුද්‍රණය හා මිලට ගැනීම.
VIII. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධිකරණය කිරීම

### කාර්යභාරය 2015

### 9.1 සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

| | සපයන ලද සේවාව | මූල්‍යය වටිනාකම රු. |
|---|---|---|
| 01. | වේයන්ගොඩ සංස්කෘතික මධ්‍යස්ථානයට ඇඳ ඇතිරිලි ,කොට්ට උර, තිර රෙදි මිල දී ගැනීම හා බොයිලේරු 02ක් හා ස්ටෑන්ඩ් 02ක් මිල දී ගැනීම | 200,857.50 |
| 02. | වෙසක් උත්සවය සඳහා වේෂ නිරූපණ ද්‍රව්‍ය හා නර්තන උපාංග | 10,000.00 |
| 03. | අළුතින් විවෘත කිරීමට නියමිත මධ්‍යස්ථාන (07) කට කාර්යාලීය උපකරණ මිල දී ගැනීම(තිහගොඩ, වේයන්ගොඩ, පැරලිය,මොනරාගල,තිරුක්කෝවිල්, වංකානෙයි, වාවකච්චේරි) | 59,975.26 |
| 04. | වෙබ් බිහිදොර යාවත්කාලීන කිරීමට අවශ්‍ය ඩොංගල් 20 ක් සැපයීම | 75,400.00 |
| 05. | ප්‍රවාහන වියදම (කඩුවෙල සිට කා.උපකරණ බලංගොඩට රැගෙන යාමට) | 10,500.00 |
| 06. | අභයගිරි ස්තූප විවෘතය කිරීමේ උස්තවය සඳහා ප්‍රථමාධාර සැපයීම | 4,520.00 |
| 07. | ආදිවාසී කෞතුකාගාරය සඳහා අක්ෂි යන්ත්‍රයක් ගැනීමට | 17,500.00 |
| 08. | දෙයියන්දර සංස්කෘතික මධ්‍යස්ථානයට මද්දල මිලදී ගැනීම. | 15,000.00 |
| 09. | ඇඹරළුව සංස්කෘතික මධ්‍යස්ථානයට වතුර මෝටරයක් මිලදී ගැනීම | 15,900.00 |
| 10. | වරකාපොළ සංස්කෘතික මධ්‍යස්ථානයට වතුර මෝටරයක් හා කොන්ක්‍රීට් වළලු මිල දී ගැනීම හා කම්කරු ගාස්තු ගෙවීම | 50,000.00 |
| 11. | රඹුක්කන සංස්කෘතික මධ්‍යස්ථානයට පරිගණක මේසයක් මිලදී ගැනීම. | 3,900.00 |
| 12. | කඹුරුපිටිය සංස්කෘතික මධ්‍යස්ථානයට කැසට් රෙකෝඩරයක් ලබාදිම. | 16,500.00 |

| | සපයන ලද සේවාව | මූල්‍යය වටිනාකම රු. |
|---|---|---|
| 13. | වැලිගම සංස්කෘතික මධ්‍යස්ථානයට වඩිගපටුන ඇඳුම් මැසීම | 167,552.00 |
| 14. | 2015 මාර්තු මස හිසවෙස් තැබීමේ මංගල්‍යයට ඇඳුම් ලබා දීම. | 80,000.00 |
| 15. | තාල භාණ්ඩ මිලදී ගැනීම (දවුල්, පහතරට බෙර, ගැටබෙරය, තම්මැට්ටම) | 2,144,000.00 |
| 16. | සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා පුස්තකාල පොත් (40,035)මිල දී ගැනීම | 9,389,975.00 |
| | **මුළු වටිනාකම** | **12,261,579.76** |

## 9.2 අමාත්‍යාංශය සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

| අනු අංකය | සපයන ලද සේවාව | මූල්‍යය වටිනාකම රු. |
|---|---|---|
| 01. | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම | 149,758,850.69 |
| 02. | ටයර් ටියුබ් මිලදී ගැනීම | 1,014,521.00 |
| 03. | බැටරි මිල දී ගැනීම | 253,379.50 |
| 04. | උත්සව සඳහා ආහාර /නවාතැන් ලබාදීම | 5,998,176.45 |
| 05. | ලිපි ද්‍රව්‍ය හා ටෝනර්/රිබන් මිල දී ගැනීම | 5,049,639.64 |
| 06. | මුද්‍රණ කටයුතු(ප්‍රගති වාර්තා, බැනර්, පොස්ටර්,නාම පුවරු, ලිපි ශීර්ෂ, ආරාධනා පත්‍ර, හඳුනා ගැනීමේ කාඩ්පත්) | 3,195,098.00 |
| 07. | පුවත්පත් දැන්වීම් | 145,551.00 |
| 08. | පුවත්පත් මිල දී ගැනීම | 369,487.50 |
| 09. | පරිගණක හා පරිගණක උපාංග මිල දී ගැනීම | 3,749,750.00 |
| 10. | ලී බඩු උපකරණ මිල දී ගැනීම | 376,072.40 |
| 11. | පරිගණක වෛරස් වැලැක්වීමේ මෘදුකාංග මිල දී ගැනීම | 231,075.00 |
| 12. | දත්ත පද්ධති මිල දී ගැනීම | 83,000.00 |
| 13. | ආදිවාසී ජනතාව වෙනුවෙන් නඟුල සහිත අත් ට්‍රැක්ටරයක් මිලදී ගැනීම | 399,000.00 |
| 14. | උත්සව සඳහා වේදිකා සැකසීම හා වෙනත් අලංකරණ කටයුතු සඳහා | 1,493,420.00 |
| 15. | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය | 223,400.00 |
| 16. | ආදිවාසී ජන උරුම කෞතුකාගාරයට පරිගණක යන්ත්‍ර 01 ක් මිලට ගැනීම | 130,050.00 |
| 17. | වෙනත් | 437,553.50 |
| | **මුළු වටිනාකම** | **172,908,024.68** |

# 10. ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ

සාරධර්ම පිරි සමාජයක් බිහිකිරීමේ මූලික අපේක්ෂාවෙන් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා ජාතික පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය මතුවිය. ඒ අනුව වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානය ඉදිකර 2008 දෙසැම්බර් 26 වන දින විවෘත කරන ලදී. ඉන්පසුව දීප ව්‍යාප්තව පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය, සම්පත්දායකයින්, අමාත්‍යාංශ කාර්ය මණ්ඩල හා ජාතික හා අන්තර්ජාතික ප්‍රසංග සඳහා ඉදිරිපත් කරන සංස්කෘතික මධ්‍යස්ථාන සිසු සිසුවියන් පුහුණු කිරීම සඳහා වන පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතයට ගනු ලැබේ.

**කාර්යය මණ්ඩලය - 2015**

| | |
|---|---|
| මාණ්ඩලික නොවන | - 04 |
| කණිෂ්ඨ | - 02 |
| කණිෂ්ඨ ආදේශක | - 04 |

**කාර්යභාරය 2015**

**10.1 අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැඩසටහන් සඳහා නොමිලේ ලබා දුන් සේවාවන්**

| සපයන ලද සේවාව | වැඩසටහන් ගණන |
|---|---|
| නේවාසික පහසුකම් පමණක් ලබාදීම | 08 |
| නේවාසික හා ශාලා පහසුකම් පමණක් ලබාදීම | 10 |
| **නොමිලේ සේවා සපයන ලද මුළු වැඩසටහන් ගණන** | **18** |

**10.2 ජාතික පුහුණු මධ්‍යස්ථානය විසින් මුදල් අයකර ලබාදුන් සේවාවන්**

| සපයන ලද සේවාව | වැඩසටහන් ගණන | ඇස්තමේන්තු මුදල රු. | රාජ්‍ය ආදායමට බැර කිරීම රු. | ආයතනික නඩත්තුව සඳහා රු. |
|---|---|---|---|---|
| නේවාසික පහසුකම් පමණක් ලබාදීම | 08 | 219,175.00 | 142,447.00 | 76,728.00 |
| නේවාසික හා ශාලා පහසුකම් පමණක් ලබාදීම | 12 | 650,850.00 | 422,826.00 | 228,024.00 |
| ශාලා පහසුකම් පමණක් ලබා දීම. | 05 | 24,600.00 | 15,990.00 | 8,610.00 |
| **මුළු ඉපයීම් වටිනාකම** | **25** | **894,625.00** | **581,263.00** | **313,362.00** |

# 11. අභ්‍යන්තර විගණන කටයුතු

## පිහිටුවීමේ පරමාර්ථ

1. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල අභ්‍යන්තර පාලන ක්‍රමයට සම්බන්ධ වී එම කටයුතු වල වැරදි හා වංචා වැලැක්වීම සහ ඒවා අනාවරණය කිරීමට යොදා ඇති අභ්‍යන්තර සෝදිසි ක්‍රමවල විධිමත් හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ හා ස්වාධීන ඇගයීමක් සිදු කිරීම.

2. එක් එක් ආයතනයන් වෙත පැවරී ඇති සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී/ ප්‍රගති සමාලෝචන කමිටුව වෙත ප්‍රගති පාලනය සම්බන්ධයෙන් සහාය වීම.

3. උචිත අවස්ථාවන් වලදී මෙම කර්තව්‍යන්හී නිරත අයවලුන් සහ ආයතන ප්‍රධානීන් සහ ප්‍රගති / අන්වේෂණ කමිටු අතර සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.

## කාර්යභාරය

1. වැරදි හා වංචා වැලැක්වීම සඳහා ආයතනය තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය, සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරීත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.

2. ගිණුම්කරණ පිළිවෙත් මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.

3. කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.

4. අලාභහානි වලින් ආයතනය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ඇති ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මක භාවය පිළිබඳ ඇගයීම.

5. රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන පරිපූරක උපදෙස් පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

6. නාස්තිය, නිෂ්කාර්ය දාරිතාවය, පමණ ඉක්මවා කෙරෙන වියදම් වැලැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට යොදා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

7. ආයතනයේ දේපළ හා වත්කම් ආරක්ෂා කිරීම හා අරපිරිමැස්මෙන් යුතුව උපයෝජනය කරන්නේ දැයි සොයා බැලීම.

8. අවශ්‍ය අවස්ථා වලදී විශේෂ විමර්ශන පැවැත්වීම.

**කාර්ය භාරය - 2015**

## 11.1 සාමාන්‍ය විගණන පරීක්ෂාවන්

1. **සංස්කෘතික මධ්‍යස්ථාන 36 ක පූර්ණ විගණන පරීක්ෂාවන් සිදු කිරීම**

| | | |
|---|---|---|
| 1. වීරඹුගෙදර | 13. බෙලිඅත්ත | 25. හංවැල්ල සීතාවක |
| 2. කන්තලේ | 14. බිංගිරිය | 26. මාලිම්බඩ |
| 3. සේරුවිල | 15. ඇඹරළුව | 27. කිරින්ද පුහුල්වැල්ල |
| 4. යටිනුවර | 16. පස්ගොඩ | 28. රිදීමාලියද්ද |
| 5. හතරලියැද්ද | 17. කටුවන | 29. බිබිල |
| 6. ඇඹිලිපිටිය | 18. කොත්මලේ | 30. බඩල්කුඹුර |
| 7. බෙන්තොට | 19. නුවරඑළිය | 31. ආණමඩුව |
| 8. ගාල්ල කඩවත්සතර | 20. ඇල්පිටිය | 32. පල්ලම |
| 9. දෙනිපිටිය | 21. නියාගම | 33. පූජාපිටිය |
| 10. මාතර නූපේ | 22. දොම්පේ | 34. පාතදුම්බර |
| 11. දෙව්නුවර | 23. ගහවටකෝරලය | 35. ගලේවෙල |
| 12. රුහුණු විශ්වවිද්‍යාලය | 24. දෙල්තොට | 36. කැකිරාව |

2. ජනකලා කේන්ද්‍රය - සාමාන්‍ය විගණනය
3. ජාතික කෞතුකාරගාර දෙපාර්තමේන්තුව - සාමාන්‍ය විගණනය
4. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව - සාමාන්‍ය විගණනය
5. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - සාමාන්‍ය විගණනය
6. ගාලු උරුමය පදනම - සාමාන්‍ය විගණන පරීක්ෂාව
7. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - සාමාන්‍ය විගණනය
8. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ගෙවීම් වව්චර් පරීක්ෂාව, අත්තිකාරම් හා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගැනීම් පරීක්ෂාව හා මූල්‍ය හා කළමණාකරන විගණනය

## 11.2 විශේෂ විගණන පරීක්ෂාවන්

1. කැස්බෑව සංස්කෘතික මධ්‍යස්ථානයේ ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීට විරුද්ධ පෙත්සම් පරීක්ෂාව
2. ගාල්ල පුරා විද්‍යා කාර්යාලයෙන් ගල් කොරි සඳහා බලපත් නිකුත් කිරීමේදී සිදු වී ඇතැයි කියන පෙත්සම් පරීක්ෂාව
3. නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථායේ ඉදිකිරීම් පරීක්ෂාව
4. පුරා විද්‍යා ප්‍රධාන කාර්යාලයේ වැටුප් ලේඛන පරීක්ෂාව
5. බෙලි අත්ත සංස්කෘතික මධ්‍යස්ථානයේ පෙත්සම් පරීක්ෂාව
6. මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්තා චිත්‍රපටි නිපදවීම පිලිබඳ පරීක්ෂාව/වව්චර් පිළිබඳ (රක්ෂණ කිරීම පිලිබඳ) විශේෂ පරීක්ෂාව
7. දීඝවාපිය,යුධගනාව,නීලගිරි සෑයයන්හි ඉදි කිරීම් හා ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාව
8. ත්‍රිකුණාමලය පුරාවිද්‍යා කාර්යාලයේ සංස්කෘතික නිලධාරීවරයෙක් පිළිබඳ විශේෂ පරීක්ෂණය
9. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනය හා මිහින්තලේ උතුරු දකුණු සංස්කෘතික හුවමාරු කලා නිකේතනයේ ඉදි කිරීම් පරීක්ෂාව හා රාජ්‍ය සංගීත කණ්ඩායමේ ඉලෙක්ට්‍රෝනික් ගිටාර් පැඩලය නැතිවීම පිලිබඳ පරීක්ෂාව.
10. දාඹාන ආදිවාසි කෞතුකාගාරයේ ප්‍රදර්ශණ මැදිරි සවි කිරීම් පරීක්ෂාව
11. කාත්තන්කුඩි සංස්කෘතික මධ්‍යස්ථානයේ හිටපු ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීගේ අය කිරීම් පරීක්ෂාව